# ආර්ථික හා සමාජ පිරිවැය*

## සමස්ත උපනති

1990 වර්ෂයෙහි දේශීය බලශක්ති අංශය තුළ දක්නට ලැබුණු කැපී පෙනුන ලක්ෂණ වූයේ ව්‍යාපාරික වාතාවරණය යහපත්වීමට අනුරූපව බලශක්ති ඉල්ලුම වැඩිවීම සහ හිතකර කාලගුණික තත්ත්වය හා ස්ථාපිත ධාරිතාවය ඉහළ නැංවීම නිසා ජල විදුලි බල උත්පාදනය වැඩිවීමයි. කෙසේ වුවද, 1990 අගෝස්තු මසදී ගල්ෆ් අර්බුදයේ ආරම්භයත් සමගම ඛනිජ තෙල් නිෂ්පාදන මිළ ගණන් සීඝ්‍ර ලෙස ඉහළ යාම, වසර තුළදී දේශීය බලශක්ති අංශයෙහි අහිත-කර ප්‍රතිවිපාකයන් ඇතිකර ලීමට සමත් විය. මේ අතර ශ්‍රී ලංකා දුම්රිය සේවය සහ පෞද්ගලික බස් රථ ධාවන හා අදාල ක්‍රියාකාරකම්හි යහපත් වර්ධනයක් දක්නට ලැබුන අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙහි කටයුතු තවදුරටත් පහත වැටිණි. රජය විසින් නිවාස අංශයට දෙනු ලැබූ ප්‍රමුඛත්වය පිළිබිඹු කරමින් 1990 වසරෙහිදී නිවාස පහළොස් ලක්ෂයේ වැඩපිළිවෙල දියත් කරනු ලැබින. කෙසේ වුවද, මූල්‍යමය වශයෙන් හා ගොඩනැගිලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ ඇතැම් සීමාකාරී තත්ත්වයන්, නිවාස අංශයෙහි ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙසින් බලපානු ලැබින. දිවයින තුළ ආරක්ෂක තත්ත්වය යහපත් වීමත් සමගම 1990 වසරෙහිදී තැපැල් සහ විදුලි සංදේශ සේවාවන්හි යහපත් වර්ධනයක් දක්නට ලැබිණි.

## බලශක්තිය

රට තුළ ආරක්ෂක තත්ත්වය යහපත් වීමත් සමගම ආර්ථික කටයුතු ප්‍රසාරණය වීම හේතුවෙන් 1990 වර්ෂයේදී විදුලිය බල ඉල්ලුම ඉහළ නැගුණි. ඉහළ නැංවූ ජල විදුලිය බල ස්ථාපිත ධාරිතාවය සහ වසරෙහි වැඩි කාලයක් තුළ පැවති යහපත් කාලගුණික තත්ත්වය, ජලවිදුලිය බල උත්පාදනය වැඩි කරලීමට හේතු විණි. මෙම තත්ත්වය මත රටේ මුලු විදුලිය බල ඉල්ලුම මුලුමනින්ම පාහේ ජල විදුලිය බලය මගින් සපුරාලීමටත්, තාප බල උත්පාදනය ඉතා සුලු මට්ටමක් දක්වා අඩු කිරීමටත්, ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) සමත් විය. කෙසේ වුවද, වසරේ අවසාන භාගයේදී ගල්ෆ් කලාපයේ ඇති වූ අස්ථාවර තත්ත්වය හේතුවෙන් ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි ඛනිජ තෙල් නිෂ්පාදිත මිළ ගණන් තියුණු ලෙස ඉහළ යාම හා ඒ හා අනුරූපව දේශීය වෙළෙඳපොළෙහි මිළ ගණන් ගැලපීම නිසා බලශක්ති අංශයට ඇතැම් දුෂ්කර තත්ත්වයනට මුහුණ පෑමට සිදුවිණි.

1990 වර්ෂයෙහිදී, දර, කෘෂිකාර්මික අපද්‍රව්‍ය, සත්ව අපද්‍රව්‍ය, සහ වෙනත් ශාඛ අපද්‍රව්‍ය වලින් සමන්විත වාණිජ නොවන බලශක්ති මූලාශ්‍රය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම බලශක්ති මූලාශ්‍රය වශයෙන් තවදුරටත් පැවතුණි. ඛනිජ තෙල් ටොන් සමක (ඛ.ටො.ස.) දශ ලක්ෂ 6.1 ක් ලෙස ඇස්ත-මේන්තු කර ඇති මෙම බලශක්ති මූලාශ්‍රය දිවයිනේ මුළු බලශක්ති සැපයුමෙන් සියයට 69 ක් නියෝජනය කර ඇත. ඛනිජ තෙල්, විදුලිය බලය, ද්‍රවඛනිජ වායුව සහ ගල් අඟුරු හා ලිග්නයිට් සුළු ප්‍රමාණයක් ඇතුලත් වූ වාණිජමය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් ඉතිරිය සමන්විත විය.

1990 මාර්තු මස රන්ටැඹේ ජල විදුලි බලාගාරයෙහි උත්පාදන කටයුතු ආරම්භ වීමත් සමගම වසර අවසානයේදී මුළු ජල විදුලිය බල ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 49 කින් වැඩි වී මෙ.වො. 1017.45 ක් බවට පත්විය. 1990 වසර අවසානය වනවිට තාපබල ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 272.2 ක් ලෙස නොවෙනස්ව පැවතිණි. මේ අනුව 1990 වසර අවසානයේදී මුලු විදුලිය බල ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 1289.65 ක් ලෙස පැවතිණි.

1990 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් උත්පාදනය කරන ලද මුළු විදුලිය බල ප්‍රමාණය කිලෝ වොට් පැය දශ ලක්ෂ 3,149 ක් වූ අතර, පසුගිය වසරෙහි වූ සියයට 2 ක වැඩිවීම හා සසඳන කළ වසර තුලදී සියයට 10 ක වැඩිවීමක් දක්නට ලැබිණි. ජලාශවල ජල මට්ටම් ඉහළ නැගීම නිසා ජල විදුලිය බල උත්පාදන යන්ත්‍ර පූර්ණ ධාරිතාවයෙන් යුක්තව ක්‍රියා කරවීමට හැකි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1990 තුළදී මුළු ජල විදුලිය බල උත්පාදනය සියයට

* මෙම අංශයට අදාළ විග්‍රහය, විවිධ ආයතනයන් විසින් සපයනු ලැබූ දත්ත සහ තොරතුරු මත පදනම් වේ.

## 1 . 23 සංඛ්‍යා සටහන

### බලශක්ති අංශයේ මූලික ලක්ෂණ 1989 – 1990

| ශීර්ෂය | ඒකක | 1989 | 1988 ට වඩා ප්‍රතිශත වෙනස | 1990* | 1989 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. ඛනිජ තෙල් නිෂ්පාදන | | | | | |
| 1.1 අපනයනය .. | රු. ද. ල. | 2,241·0 | –1·0 | 3,973·8 | 77·3 |
| එම .. | විගැහි ද. ල. | 48·5 | –8·3 | 73·0 | 50·5 |
| 1.2 ආනයනය .. | රු. ද. ල. | 8,376·3 | 6·9 | 14,366·9 | 71·5 |
| එම .. | විගැහි ද. ල. | 181·3 | –1·1 | 264·0 | 45·6 |
| 1.3 ආනයනය කල ප්‍රමාණය .. | | | | | |
| 1.3.1 බොර තෙල් .. | මෙ. ටො. | 1,275,059 | –32·7 | 1,778,866 | 39·5 |
| 1.3.2 පිරිපහදු නිෂ්පාදන .. | මෙ. ටො. | 374,344 | 161·6 | 124,986 | –66·6 |
| 1.3.3. අනෙකුත් නිෂ්පාදන .. | මෙ. ටො. | 21,320 | –20·1 | 29,055 | 36·3 |
| 1.4 බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල .. | රුපියල් | 628·31 | 29·7 | 942·51 | 50·0 |
| එම .. | එ. ජ. ඩොලර් | 17·43 | 6·0 | 23·53 | 35·0 |
| 1.5 දේශීය අලෙවිය | | | | | |
| 1.5.1. පෙට්‍රල් .. | මෙ. ටො. | 172,864 | 9·2 | 178,948 | 3·5 |
| 1.5.2. ඔටෝ ඩීසල් .. | ,, | 483,551 | –3·3 | 512,670 | 6·0 |
| 1.5.3. බැර ඩීසල් .. | ,, | 22,734 | –54·1 | 20,079 | –11·7 |
| 1.5.4. සුපිරි ඩීසල් .. | ,, | 16,585 | –14·1 | 16,681 | 0·6 |
| 1.5.5. භූමි තෙල් .. | ,, | 160,033 | –4·7 | 167,196 | 4·5 |
| 1.5.6. ද්‍රව් තෙල් .. | ,, | 151,044 | –7·7 | 160,459 | 6·2 |
| 1.6 දේශීය මිල | | | | | |
| 1.6.1. පෙට්‍රල් .. | රු/ලීටර | 20·00 | 48·1 | 30·00 | 50·0 |
| 1.6.2. ඔටෝ ඩීසල් .. | ,, | 9·60 | 18·1 | 11·00 | 14·6 |
| 1.6.3. බැර ඩීසල් .. | ,, | 9·20 | 17,5 | 10·60 | 15·2 |
| 1.6.4. සුපරි ඩීසල් .. | ,, | 10·90 | 17·5 | 13·00 | 19·3 |
| 1.6.5. භූමි තෙල් .. | ,, | 6·58 | — | 8·80 | 33·7 |
| 1.6.6. ද්‍රව් තෙල් .. | | | | | |
| 500 .. | ,, | 5·00 | 18·5 | 6·60 | 32·0 |
| 800 .. | ,, | 4·70 | 21·4 | 6·30 | 34·0 |
| 1000 .. | ,, | 4·55 | 22·3 | 6·00 | 31·9 |
| 1.6.7. තාර .. | ,, | 8·45 | 17·0 | 11·00 | 30·2 |
| 2. විදුලිය බලය | | | | | |
| 2.1 ස්ථාපිත ධාරිතාවය .. | මෙගවොට් | 1,240·65 | 2·7 | 1,289·65 | 3·9 |
| 2.1.1. ජල බලය .. | ,, | 968·45 | 3·2 | 1,017·45 | 5·1 |
| 2.1.2. තාප බලය .. | ,, | 272·20 | 0·8 | 272·20 | — |
| 2.2 ජනනය කල ඒකක .. | කි.වො.පැ.ද.ල. | 2,858·1 | 2·1 | 3,149·4 | 10·2 |
| 2.2.1. ජල බලය .. | ,, | 2,801·5 | 7·8 | 3,144·6 | 12·2 |
| 2.2.2. තාප බලය .. | ,, | 56·6 | –72·0 | 4·8 | –91·5 |
| 2.3 මුළු අලෙවිය .. | ,, | 2,346·8 | –0·8 | 2,560·7 | 9·1 |
| 2.3.1. ගෘහස්ථ .. | ,, | 420·8 | 3·8 | 508·6 | 20·9 |
| 2.3.2. කාර්මික .. | ,, | 844·3 | –6·2 | 887·3 | 5·1 |
| 2.3.3. වාණිජ .. | ,, | 440·8 | –1·6 | 509·2 | 15·5 |
| 2.3.4. පලාත් පාලන ආයතන | ,, | 623·7 | 5·0 | 638·1 | 2·3 |
| 2.3.5. වීදි ආලෝක කිරීම .. | ,, | 17·2 | 1·2 | 17·5 | 1·7 |

* තාවකාලික.

මූලයන් : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව; ලංකා විදුලිබල මණ්ඩලය.

12 කින් වැඩි වී කිලෝ වොට් පැය දශ ලක්ෂ 3,145 ක් විය. මේ අනුව 1990 වසර තුළදී මුළු විදුලිය බල උත්පාදනය මුළුමනින්ම පාහේ ජල විදුලිය බල මූලාශ්‍රයනට සීමා වුනු අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් වාණිජමය බලශක්ති අංශයෙහි, ජල විදුලිය බලයට අදාළ කොටස 1989 දී සියයට 26 සිට 1990 දී සියයට 29 දක්වා වැඩි විය. මෙයට සමානුපාතිකව තාප බල උත්පාදනය කිලෝ වොට් පැය දශ ලක්ෂ 56 සිට කිලෝ වොට් පැය දශ ලක්ෂ 4.88 දක්වා පහත වැටීන. විදුලිය බල උත්පාදනයෙහි ලා ඛනිජ තෙල් නිෂ්පාදිත උපයෝගී කරගැනීම තියුණු ලෙසින් පහත වැටීම හේතුවෙන් විදුලිය බල උත්පාදනයෙහි ඒකක පිරිවැය අඩු වූවා මෙන්ම ගෙවුම් ශේෂයටද සහනදායි ලෙසින් බලපානු ලැබිණි. මේ අතර විදුලිය බල උත්පාදන හා බෙදා හැරීමේදී දූරිමට සිදුවූ පාඩුව පසුගිය වසර හා සසඳන කළ කිලෝ වොට් පැය දශ ලක්ෂ 511 සිට 589 දක්වා එනම් මුළු විදුලිය බල උත්පාදනයෙන් සියයට 17.9 සිට සියයට 18.7 දක්වා වැඩිවිය. උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති අභ්‍යන්තරික නොසන්සුන්තා නිසා එම ප්‍රදේශ තුළ සිදු වූ මුළු විදුලිය අලෙවි කිරීම නිසියාකාරව වාර්තා නොවීම මෙම පාඩුව වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය 1990 අප්‍රේල් මස 1 දින සිට බලපැවැත්වෙන පරිදි විදුලිය බල ගාස්තු ප්‍රතිශෝධනය කරනු ලැබිණි. ගෘහස්ථ අංශය සඳහා විදුලිය බල ගාස්තු සියයට 50 කින් වැඩි කරන ලද නමුත්, ඒකක 50 දක්වා මිළෙහි වෙනසක් සිදු කරනු නොලැබිනි. කාර්මික හා වාණිජ අංශ සඳහා විදුලිය බල ගාස්තු වැඩිවීම පිළිවෙලින් සියයට 34–43 හා 55–64 අතර පරාසයන්හි විය. මේ අතර හෝටල් අංශය සඳහා ගාස්තු වැඩිවීම සියයට 59-69 අතර විය. මීට අමතරව නව සංශෝධන යටතේ දවසේ වේලාව මත අයකිරීමේ විදුලිය අලෙවි ක්‍රමය කුඩා කර්මාන්ත සඳහා ද හඳුන්වා දෙනු ලැබිණි. පැරණි සහ ප්‍රතිශෝධිත ගාස්තු සංඛ්‍යා සටහන 1.24 මගින් දැක්වේ. මෙම නව මිළ සංශෝධනය මගින් ලංකා විදුලිබල මණ්ඩලය, එහි සාමාන්‍ය ශුද්ධ ස්ථාවර වත්කම් වලින් සියයට 8 ක ඵලදායිතාවයක් ලබා ගැනීමටත්, ණය සේවා අනුපාතය 1.5 කට නොඅඩු මට්ටමක පවත්වා ගැනීමට සහ ප්‍රාග්ධන ආයෝජනය සඳහා වැය වන මූල්‍ය ප්‍රමාණයෙන් සියයට 30 ක් අභ්‍යන්තර මූල්‍ය ජනනයෙන් ලබාගැනීමටත් අපේක්ෂා කරන ලදී.

විදුලිබල ගාස්තු වල තියුණු වැඩිවීමක් තිබියදී වුවද, මුළු විදුලිය අලෙවිය සියයට 9 කින් වැඩිවී කිලෝ වොට් පැය දශ ලක්ෂ 2,5 61ක් විය. කෙසේ වුවද, උතුරු සහ නැගෙනහිර පළාත් වල සිවිල් අරගල නොපැවතියේ නම් මෙම වැඩිවීම මීට වඩා ප්‍රමාණයකින් ඉහල යාමට ඉඩ තිබුණි. ඉකුත් වසරෙහි සියයට 4 ක් හා සසඳන කල ගෘහස්ථ අංශය සඳහා වූ විදුලිය අලෙවිය සියයට 21 ක විශාලතම වැඩිවීමක් වාර්තා කරනු ලැබින. කාර්මික අංශය හා වාණිජ අංශය සඳහා වූ විදුලිය අලෙවි කිරීම පිළිවෙලින් සියයට 5 කින් වැඩිවී කිලෝ වොට් පැය දශ ලක්ෂ 887 ක්ද, සියයට 16 කින් වැඩිවී කිලෝ වොට් පැය දශ ලක්ෂ 509 ක්ද විය. රට තුල ආරක්ෂක තත්ත්වය දියුණු වීමත් සමගම මෙම අංශයන්හි ක්‍රියාකාරකම් ප්‍රසාරණය වීම මෙයින් පිළිබිඹු වේ. මේ අතර 1990 දී පළාත් පාලන ආයතනයනට කළ විදුලිය තොග විකුණුම් සියයට 2 කින් වැඩි වී කිලෝ වොට් පැය දශ ලක්ෂ 638 ක් විය.

ඛනිජ තෙල් නිෂ්පාදිතයන්ගේ ජාත්‍යන්තර මිළ ගණන් ඉහළ යාම හා ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන පරිමාව වැඩිවීම 1990 දී විදේශ විනිමය පිරිවැය විශාල වශයෙන් වැඩි වීමට හේතු විය. 1989 දි ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා වූ පිරිවැය මුළු ආනයනයන්ගෙන් සියයට 10 ක් වූ අතර 1990 දී එය සියයට 13 දක්වා ඉහළ නැගුණි. බොර තෙල් බැරලයක් සඳහා වූ මිළ 1989 දී ඇ.එ.ජ. ඩොලර් 17.43 (රුපියල් 628) සිට 1990 දී ඇ.එ.ජ. ඩොලර් 23.53 (රුපියල් 943) දක්වා සියයට 35 කින් ඉහළ නැගුණි. බොර තෙල් ආනයන පරිමාව සියයට 40 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 1,778,866 ක් විය. මීට ප්‍රතිවිරුද්ධ වශයෙන්, ඛනිජ තෙල් පිරිපහදුව බාධාවකින් තොරව ක්‍රියාත්මක වීම නිසා ආනයනික පිරිපහදු නිෂ්පාදන ප්‍රමාණය 1989 දී මෙ.ටො. 374,344 සිට 1990 දී මෙ.ටො. 124,986 දක්වා පහත වැටීන.

## 1 . 24 සංඛ්‍යා සටහන

### සංශෝධිත විදුලිබල ගාස්තු

| අංශය | පැරණි ගාස්තු (රු/කි.වො.පැ) | සංශෝධිත ගාස්තු (රු/කි.වො.පැ) | ප්‍රතිශත වැඩිවීම |
|---|---|---|---|
| **ගෘහස්ථ** | | | |
| ඒකක 0–10 .. .. | 0·55 | 0·55 | — |
| 11–50 .. .. | 1·05 | 1·05 | — |
| 51–100 .. .. | 1·05 | 2·00 | 90 |
| 101–450 .. .. | 2·00 | 3·00 | 50 |
| > 450 .. .. | 2·45 | 4·00 | 62 |
| **ආගමික ස්ථාන** | | | |
| ඒකක 0–150 .. .. | 0·60 | 0·80 | 33 |
| > 150 .. .. | 2·00 | 2·95 | 48 |
| **කාර්මික** | | | |
| කුඩා .. .. | 1·75 | 2·35 | 34 |
| මධ්‍යම .. .. | 1·60 | 2·20 | 38 |
| විශාල .. | 1·50 | 2·15 | 43 |
| **පොදු කාර්යය** | | | |
| කුඩා .. .. | 2·00 | 3·10 | 55 |
| මධ්‍යම .. .. | 1·90 | 3·05 | 61 |
| විශාල .. .. | 1·80 | 2·95 | 64 |
| **හෝටල්** | | | |
| කුඩා .. | 1·95 | 3·10 | 59 |
| මාධ්‍යම .. .. | 1·85 | 3·05 | 65 |
| විශාල .. .. | 1·75 | 2·95 | 69 |

මූලය : ලංකා විදුලිබල මණ්ඩලය.

සටහන : කුඩා – වෝල්ට් 400/230 බලයකින් සපයන්නාවූ සහ ගිවිසගත් අවශ්‍යතාවය කිලෝ වෝල්ට් ඇම්පියර් 50 ට අඩු

මධ්‍යම – වෝල්ට් 400/230 බලයකින් සපයන්නාවූ සහ ගිවිසගත් අවශ්‍යතාවය කිලෝ වෝල්ට් ඇම්පියර් 50 ට සමාන හෝ වැඩි

විශාල – කිලෝ වෝල්ට් 11, කිලෝ වෝල්ට් 33, කිලෝ වෝල්ට් 132 බලයකින් විදුලිය සැපයීම.

දවසේ වෙලාව අනුව ගාස්තු අදල වන්නේ කාර්මික හා හෝටල් අංශ වලට පමනි. මුදුන් පැයේදි සහ අනිකුත් වේලාවන් සඳහා ගාස්තු පිළිවෙලින් සියයට 102-116 සහ සියයට 35-45 වශයෙන් සංශෝධනය කරන ලදි.

ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඛනිජ තෙල් නිෂ්පාදිතයන්හි මිළ ගණන් ඉහළයැම හා අනුරූපව දේශීය මිළ ගණන්ද දෙවතාවකදී එනම් අගෝස්තු 15 සහ නොවැම්බර් 6 යන දිනයන්හිදී ඉහළ නංවනු ලැබින. 1989 වසර හා සසඳන කළ විශාලතම වැඩිවීම වාර්තා වූයේ පෙට්‍රල් (සියයට 75 ක්) සඳහා වූ අතර, අඩුම වැඩිවීම දූවිතෙල් (සියයට 30 – 34 අතර) සඳහා විය. 1983 සිට නොවෙනස්ව පැවති භූමිතෙල් මිළද සියයට 34 කින් වැඩි කරනු ලැබින. කෙසේ වුවද ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි මිළ ගණන් ස්ථායිතාවයට පත්වීමත් සමහම ඇතැම් නිෂ්පාදිත හා අදාළ මිළ ගණන් දෙසැම්බර් 27 වෙනි දින නැවත පහත හෙලනු ලැබින. ප්‍රතිශෝධිත මිළ ගණන් පිළිබඳ තොරතුරු සංඛ්‍යා සටහන 1.25 හි දක්වේ.

දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන පරිභෝජනය 1989 දී මෙ.ටො. 1,071,350 සිට 1990 දී මෙ.ටො. 1,136,111 දක්වා සියයට 6 කින් ඉහළ නැගුණි. කෙසේ වුවද, වසරේ අවසාන මාස 5 තුළදී දේශීය මිළ ගණන් තියුණු ලෙසින් ඉහල යාම නිසා ඇතැම් ඛනිජ තෙල් නිෂ්පාදිතයන් සඳහා වූ ඉල්ලුම පහත වැටින. ඉකුත් වසරේදී සියයට 9 කින් වැඩි වූ පෙට්‍රල් ඉල්ලුම 1990 දී වැඩි වූයේ සියයට 4 කින් පමණි. ඔටෝ ඩීසල් සහ භූමිතෙල් පරිභෝජනය පිළිවෙලින් සියයට 6 කින්

සහ සියයට 5 කින් වැඩි විය. දිවයින තුළ පැවති අභ්‍යන්තරික නොසන්සුන්තා මගහැරී යාමත් සමගම කාර්මික කටයුතුවල වැඩිවීමක් පිළිබිඹු කරමින් දූවි තෙල් අලෙවිය 1990 දී සියයට 6 කින් වැඩි විය. ඉකුත් වසරෙහිදී දූවි තෙල් අලෙවිය සියයට 7 කින් පහත වැටුණි. මේ අතර ද්‍රව ඛනිජ වායු පරිභෝජනයද මෙ.ටො. 18,718 දක්වා සියයට 23 කින් වැඩි විය.

**1 . 25 සංඛ්‍යා සටහන**

**සංශෝධිත ඛනිජ තෙල් නිෂ්පාදිත ගාස්තු**

| නිෂ්පාදනය | | පැරණි ගාස්තු (ලීටරයකට) | සංශෝධිත ගාස්තු (ලීටරයකට) | | |
|---|---|---|---|---|---|
| | | | 15·08·90 | 06·11·90 | 27·12·90 |
| | | රු. ශත. | රු. ශත | රු. ශත | රු. ශත |
| පෙට්‍රල් | .. | 20·00 | 25·00 | 35·00 | 30·00 |
| පෙට්‍රල් තරු '3' | .. | 22·00 | 27·00 | 38·00 | 32·50 |
| ඔටෝ ඩීසල් | .. | 9·60 | 11·00 | 13·00 | 11·00 |
| භූමි තෙල් | .. | 6·58 | 8·00 | 8·80 | 8·80 |
| බැර ඩීසල් | .. | 9·20 | 10·60 | 12·50 | 10·60 |
| සුපිරි ඩීසල් | .. | 10·90 | 12·50 | 15·00 | 13·00 |
| දූවි තෙල් 200 | .. | 5·79 | 6·65 | 7·50 | 7·50 |
| ,, 500 | .. | 5·00 | 5·75 | 6·60 | 6·60 |
| ,, 800 | .. | 4·70 | 5·40 | 6·30 | 6·30 |
| ,, 1000 | .. | 4·55 | 5·25 | 6·00 | 6·00 |
| ,, 1500 | .. | 4·29 | 4·90 | 5·60 | 5·60 |
| ,, 2000 | .. | 4·15 | 4·75 | 5·40 | 5·40 |
| ,, 3500 | .. | 3·83 | 4·40 | 5·00 | 5·00 |
| තාර | .. | 8·45 | 9·70 | 11·00 | 11·00 |
| එල්. පී. ගෑස් / කි. ග්‍රෑ. | .. | 8·86 | 10·20 | 11·20 | 11·20 |

මූලයන් : ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව.

1990 දී මෙ.ටො. 620,610 ක් වූ ඛනිජ තෙල් නිෂ්පාදන අපනයන ප්‍රමාණය, සියයට 29 ක වැඩිවීමක් වාර්තා කරනු ලැබින. මේ අනුව ඛනිජ තෙල් නිෂ්පාදන වෙතින් වූ දළ ඉපැයීම් ප්‍රමාණය 1989 දී රුපියල් දශ ලක්ෂ 2,242 (වි.ගැ.හි. දශ ලක්ෂ 49) සිට 1990 දී රුපියල් දශ ලක්ෂ 3,974 (වි. ගැ. හි. දශ ලක්ෂ 73) දක්වා සියයට 77 කින් (වි.ගැ.හි. අනුව සියයට 51 කින්) වැඩි විය.

## ගමනාගමනය

1990 වර්ෂය තුළදී විවිධ ගමනාගමන අංශයන් තුළ පැවති එකිනෙකට ප්‍රතිවිරුද්ධ ක්‍රියාකාරිත්වයන් හේතු කොටගෙන ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ මිශ්‍ර ප්‍රතිඵල දක්නට ලැබුණි. පසුගිය වර්ෂ කිහිපය තුළදී රථ ඇණියට සිදුවූ අලාභහානි සහ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල අභ්‍යන්තර නොසන්සුන්තා උත්සන්න වීම නිසා ශ්‍රී ලංකා ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයන්හි (ශ්‍රී.ලං. ප්‍රා.ග.ම.) ධාවන කටයුතු විශාල වශයෙන් සීමාවිය. එසේ වුවද, උතුරු සහ නැගෙනහිර පළාත්හි දුම්රිය සේවා යථා තත්ත්වයට පත්වීම සමඟ ශ්‍රී ලංකා දුම්රිය (ශ්‍රී.ලං.දු.) සේවයේ සැළකියයුතු ප්‍රගතියක් දක්නට ලැබුණි. එහෙත්, එම ප්‍රදේශයන්හි අභ්‍යන්තර නොසන්සුන්තා නැවත ආරම්භවීම නිසා වසරේ අවසාන භාගයේදී දුම්රිය සේවයේ ධාවන කටයුතු තරමක් දුරට අඩාල විය. අනෙක් අතට, ණය පහසුකම් ලබාගැනීමට පවත්නා අවකාශය වැඩිවීම සහ රජය සපයන ලද බදු සහන හේතුකොටගෙන පෞද්ගලික අංශයට එහි ධාවන කටයුතු පුළුල් කිරීමට හැකිවිය. මේ අතර, මෙම වර්ෂයේදී ඉන්ධනවල දේශීය මිළ ගණන් විශාල වශයෙන් ඉහල යාම නිසා සියළුම ගමනා ගමන මාධ්‍යයන්හි ගාස්තු වැඩි කරනු ලැබිණි.

1990 දී ශ්‍රී ලංකා ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයන්හි ධාවන පරිමාව තවදුරටත් පහත වැටුණි. 1990 දී ධාවන කිලෝමීටර් ප්‍රමාණය දශ ලක්ෂ 245 දක්වා සියයට 6 කින් අඩුවිය. මෙලෙස ධාවන පරිමාව අඩු වීමට විශාල වශයෙන් හේතු වූයේ පසුගිය වසර කිහිපය තුළදී රථ ඇණියට හානි පැමිණවීමෙන් ධාවනය සඳහා සුදුසුවූ බස්රථ සංඛ්‍යාව සැළකිය යුතු ලෙස අඩුවීම සහ 1990 වසරේ මැද භාගයේ සිට උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි අභ්‍යන්තර නොසන්සුන්තා උත්සන්න වීමත්ය. බස්රථ 66 ක් රථ ඇණියට අළුතෙන් එක්කරන ලද නමුත්, දිනකට ධාවනය කරන ලද සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව 1989 දී පැවති 3,672 සිට 1990 දී 3,300 දක්වා තවදුරටත් පහත වැටුණි. මෙයට අමතරව රථ ඇණියෙහි අබලන් තත්ත්වය සහ සාමාන්‍ය නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය වන අමතර කොටස් හිඟකම ද ධාවන ප්‍රමාණය අඩුවීම කෙරෙහි හේතු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වර්ෂය තුළදී ශ්‍රී ලංකා ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩල වලට ධාවනය කිරීමට හැකිවූයේ නියමිත ප්‍රමාණයෙන් අඩකටත් අඩු ප්‍රමාණයකි.

ධාවන පරිමාව මෙලෙස අඩු වුවද 1990 දී ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයන්හි මගී කිලෝ මීටර ප්‍රමාණය දශ ලක්ෂ 13,327 දක්වා සියයට 3 කින් ඉහළ ගියේය. මේ අතර, දේශීය වෙළෙඳ පොළෙහි ඔටෝ ඩීසල් මිළ ඉහළ යාමෙන් ඇති වූ අතිරේක වියදම් පියවා ගැනීම සඳහා 1983 සිට නොවෙනස්ව පැවති ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මගී ප්‍රවාහන ගාස්තු 1990 අගෝස්තු මස 26 දින සිට බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙහි මගී ගාස්තු කිලෝමීටරයකට ශත 17 සිට ශත 27 දක්වා සියයට 57 කින් වැඩිවිය. මගී කිලෝමීටර ප්‍රමාණයේ සුළු වර්ධනය සහ මගී ගාස්තුවල වැඩිවීම හේතුකොටගෙන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙහි මුළු ආදායම 1989 දී රුපියල් දශ ලක්ෂ 2,242 සිට 1990 දී රුපියල් දශ ලක්ෂ 2,618 දක්වා සියයට 17 කින් ඉහල නැගුණි.

පසුගිය වර්ෂයන්හිදී දුරිමට සිදුවූ අධික පාඩු නිසා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය ආර්ථික වශයෙන් කාර්යක්ෂම වූත්, මූල්‍යමය වශයෙන් යහපත් වූත්, ව්‍යාපාරයක් කිරීමේ අරමුණෙන් එය ජනතාකරණය කිරීමට රජය තීරණය කරනු ලැබින. මෙය ආර්ථික ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල යටතේ රජය විසින් ක්‍රියාත්මක කරන ලද පෞද්ගලිකකරණය වැඩ පිළිවෙලෙහි තවත් පියවරක් වේ. මෙම ජනතාකරණ යෝජනාක්‍රමය යටතේ ඩිපෝ පදනම් කරගත් ස්වාධීන ව්‍යාපාරික ඒකක 40–50 අතර ප්‍රමාණයක් පිහිටුවීමට ප්‍රවාහණ අමාත්‍යාංශය අපේක්ෂා කරයි. කළමනාකරණය පිළිබඳව ක්‍රියාකාරී සහභාගිත්වයක් උදෙසා සේවකයන් උනන්දු කරවීමේ අරමුණෙන් ඩිපෝවල කළමනාකරණය සේවකයින් මගින් පත්කළ නිළධාරී මණ්ඩල යකට පැවරේ. මෙහි ප්‍රථම පියවරේදී සියයට 50 ක කොටස් ප්‍රමාණයක් සේවකයන් අතරේ නොමිලේ පවරා දෙන අතර, ඉතිරිය මූල්‍යමය ආයතනයන් භාරයේ පවතිනු ඇත. අවුරුදු 3 සිට 5 දක්වා කාලයකට පසු ඉතිරි කොටස්ද සේවකයන් හට පවරා දෙන අතර ඒ මගින් මෙම ව්‍යාපාරයෙහි අවසාන හිමිකරුවන් සේවකයන් වීමට ඉඩකඩ සළසනු ඇත. ජනතාකරණ වැඩපිළිවෙලේ ප්‍රථම පියවර වශයෙන් 1990 දෙසැම්බර් මාසයේ 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රත්මලාන, මීගමුව සහ මහනුවර දකුණ යන ඩිපෝ තුන මහජන සන්තක සමාගම් බවට පත්කරන ලදී. මේ අතර, පිරිවැය අවම කිරීමේ උපක්‍රමයක් ලෙස 1990 අප්‍රේල් මාසයේදී හඳුන්වාදෙන ලද ස්වේච්ඡා විශ්‍රාම වැඩපිළිවෙල හේතුකොටගෙන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව 1989 හා සැසඳීමේදී 1990 වර්ෂය අවසානය වන විට 37,577 දක්වා සියයට 26 කින් අඩු කරනු ලැබින.

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයන්හි කටයුතු හා සසඳන විට විමසුමට ලක්වන වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ක්‍රියාකාරිත්වයෙහි ප්‍රගතියක් දක්නට ලැබුණි. වර්ෂයේ ප්‍රථම භාගයේදී කන්කසන්තුරෙයි, තලෙයිමන්නාරම, මඩකලපුව සහ ත්‍රිකුණාමලය මාර්ග ඔස්සේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවලට සිය සේවාවන් යලි ආරම්භ කිරීමට ශ්‍රී ලංකා දුම්රිය සේවය සමත් විය. මෙයට අමතරව, මෙම කාලපරිච්ඡේදය තුළදී රාත්‍රී දුම්රිය හා උත්සව සහ වන්දනා කාලයන්හිදී විශේෂ දුම්රිය ද ධාවනය කර ඇත. කෙසේ වුවද, 1990 මැද සිට උතුරු සහ නැගෙනහිර

ප්‍රදේශයන්හි අභ්‍යන්තරික නොසන්සුන්තා යළි උත්සන්න වීමත් සමග එම ප්‍රදේශයන්හි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ධාවන කටයුතුවලට බාධා ඇතිවිය. මේ අනුව 1989 දී දශ ලක්ෂ 5.7 ක් වූ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ධාවන කිලෝ මීටර් ප්‍රමාණය 1990 දී දශ ලක්ෂ 7.5 දක්වා සියයට 32 කින් ඉහළ ගියේය. ඒ සමගම ගමනා ගමන පරිමාවෙහි වැඩිවීමක් දක්වමින් මගී කිලෝ මීටර් ප්‍රමාණයද 1989 දී දශ ලක්ෂ 1,734 සිට 1990 දී දශ ලක්ෂ 2,485 දක්වා සියයට 43 ක සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩිවිය. මේ අතර, බඩු ප්‍රවාහණය 1989 දී පැවති බඩු ටොන් කිලෝ මීටර දශ ලක්ෂ 170 සිට 1990 දී කිලෝ මීටර දශ ලක්ෂ 167 දක්වා සියයට 1 කින් අඩුවිය.

### 1 . 26 සංඛ්‍යා සටහන

### ගමනාගමන අංශයේ මූලික ලක්ෂණ 1989 – 1990

| ශීර්ෂය | ඒකකය | 1989 | 1988 ට වඩා ප්‍රතිශත වෙනස | 1990* | 1989 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| **1. මෝටර් රථ නව ලියාපදිංචි කිරීම** | | | | | |
| 1·1 ශ්‍රී ලං. ග. ම. බස්රථ .. | සංඛ්‍යාව | 260 | 6·1 | 78 | – 70·0 |
| 1·2 පෞද්ගලික බස්රථ .. | ,, | 441 | – 48·6 | 1,159 | 161·0 |
| 1·3 පෞද්ගලික මෝටර්රථ .. | ,, | 11,921 | 8·0 | 15,061 | 26·3 |
| 1·4 මෝටර් බයිසිකල් .. | ,, | 66,696 | 140·0 | 84,424 | 26·6 |
| 1·5 භාණ්ඩ ප්‍රවාහන වාහන .. | ,, | 2,457 | – 1·9 | 2,813 | 14·5 |
| 1·6 ඉඩම් වාහන .. | ,, | 2,603 | 11·1 | 2,569 | – 1·3 |
| 1·7 වෙනත් .. | ,, | 14 | 1,300 | 21 | 50 |
| **2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී.ලං.ග.ම.)** | | | | | |
| 2·1 ධාවන කිලෝ මීටර් .. | දශ ලක්ෂ | 260·7 | 21·8 | 245·4 | – 5·9 |
| 2·2 මගී කිලෝ මීටර් .. | ,, | 12,980·0 | – 15·8 | 13,327·0 | 2·7 |
| 2·3 මුළු ආදායම .. | රු. දශ ලක්ෂ | 2,242·4 | – 10·7 | 2,617·7 | 16·7 |
| 2·4 මුළු වියදම .. | ,, | 2,755·2 | – 10·1 | ලැ· නො· | — |
| 2·5 අතිරික්තය (+)/හිඟය (–) .. | ,, | – 512·8 | 0·5 | ලැ· නො· | — |
| **3. ශ්‍රී ලංකා දුම්රිය සේවය** | | | | | |
| 3·1 ධාවන කිලෝ මීටර් .. | දශ ලක්ෂ | 5·7 | – 13·6 | 7·5 | 31·6 |
| 3·2 මගී කිලෝ මීටර් .. | ,, | 1,733·9 | – 6·7 | 2,484·7 | 43·3 |
| 3·3 බඩු ටොන් කිලෝ මීටර් .. | ,, | 169·7 | – 14·1 | 167·3 | – 1·4 |
| 3·4 මුළු ආදායම .. | රු. දශ ලක්ෂ | 457·7 | – 1·4 | 638·4 | 39·5 |
| 3·5 මුළු වියදම .. | ,, | 883·1 | 2·3 | 1,056·7 | 19·7 |
| 3·6 අතිරික්තය (+)/හිඟය (–) .. | ,, | – 425·4 | 6·6 | – 418·3 | – 1·6 |

* තාවකාලික.

මූලයන් : ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.

දේශීය වෙළෙඳපොළේ ඉන්ධන මිළ ඉහල යාමට අනුකූලව ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මගී ගාස්තු 1990 අගෝස්තු මස 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරන ලදී. ඒ අනුව තුන්වැනි පන්තියේ ගාස්තු කිලෝමීටරයකට ශත 17 දක්වා සියයට 30 කින් වැඩි වූ අතර නගරාසන්න ප්‍රදේශවල එම ගාස්තුව කිලෝමීටරයකට ශත 21 දක්වා සියයට 50 කින් වැඩිවිය. පළමු හා දෙවැනි පන්තිවල මගී ගාස්තු පිළිවෙලින් සියයට 26 කින් සහ සියයට 27 කින් වැඩිවී ඇත. භාණ්ඩ ප්‍රවාහන ගාස්තු 1990 ජුනි මස 11 දින සහ 1990 ජුනි මස 26 දිනද සංශෝධනය කර ඇත. මගී කිලෝමීටර ප්‍රමාණයේ සැළකිය යුතු වැඩිවීමක් සමඟ මගී ප්‍රවාහන ගාස්තු ඉහළ යාම ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මුළු ආදායම 1990 දී රුපියල් දශ ලක්ෂ 638 දක්වා සියයට 40 කින් වැඩිවීම සඳහා හේතුවිය. එසේම, මුළු වියදම රුපියල් දශ ලක්ෂ 1,057 දක්වා සියයට 20 කින් ඉහළ ගිය අතර, එමගින් ශ්‍රී ලංකා දුම්රිය සේවයට දැරීමට වූ පාඩුව 1989 දී පැවති රුපියල් දශ ලක්ෂ 425 සිට 1990 දී රුපියල් දශ ලක්ෂ 418 දක්වා අඩුවිය.

1989 හා සසඳන විට 1990 දී පෞද්ගලික අංශය මගින් පවත්වාගෙන යන ලද මගී ප්‍රවාහන සේවයේ සැළකියයුතු වැඩිවීමක් දක්නට ලැබුණි. මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අනුව, 1989 දී 388 ක් වූ අළුතෙන් ලියාපදිංචි කරන ලද මගී ප්‍රවාහන බස්රථ සංඛ්‍යාව 1990 දී 1,071 දක්වා ආසන්න වශයෙන් තෙගුණයකින් ඉහළ ගොස් ඇත. ජාතික සංවර්ධන බැංකුව වෙතින් සුළු සහ මධ්‍ය පරිමාන කර්මාන්ත ණය ක්‍රමය යටතේ සහනදායී පොළී අනුපාතයකට බස් රථ මිළදී ගැනීම සඳහා ණය අරමුදල් ලබාගත හැකිවීම සහ ආසන සංඛ්‍යාව 30 ට වැඩි බස් රථ ආනයනය කිරීම උදෙසා ආනයන හා පිරිවැටුම් බදු සහන ලබාදීම හේතුවෙන් රථවාහන මිළ ගණන් අඩුවීම පෞද්ගලික බස් රථ ප්‍රවාහන කටයුතුවල වැඩිදියුණුව කෙරෙහි බලපානු ලැබීය.

## නිවාස ඉදි කිරීම

1989 වර්ෂයේදී නිවාස දශ ලක්ෂයේ වැඩසටහන සම්පූර්ණ වීමත් සමග, 1990 වර්ෂයේදී නිවාස සංවර්ධනය පිළිබඳ ප්‍රධාන අවධානය නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන වෙත යොමු කරනු ලැබීන. 1984-89 දක්වා ක්‍රියාත්මක කරන ලද නිවාස දශ ලක්ෂයේ වැඩසටහන හා 1979-83 දක්වා ක්‍රියාත්මක කරන ලද නිවාස ලක්ෂයේ වැඩසටහන මගින් ලැබුනු අත්දැකීම් මත මෙම නව වැඩසටහන සකසන ලදී. මෙම වැඩසටහනෙහි මූලික අරමුණු වන්නේ පවුල් ලක්ෂ 15 ක් සඳහා නව නිවාස ඉදි කිරීම, පවතින නිවාසවල තත්ත්වය ඉහළ නැංවීම හා දුප්පත් ජනතාවගේ නිවාස වැඩිදියුණු කිරීම සඳහා ණය සහ ආධාර ලබාදීම වේ. මෙම වැඩසටහන 1990 වර්ෂයේ සිට වර්ෂ 6 ක් සඳහා ක්‍රියාත්මක වේ.

නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන දීප ව්‍යාප්ත වැඩසටහනක් වන අතර, උප-වැඩසටහන් 11 ක් යටතේ එය ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම උප-වැඩසටහන් ලෙස ග්‍රාමීය නිවාස උප-වැඩසටහන, නාගරික නිවාස උප-වැඩසටහන, ආපදා නිවාස උප-වැඩසටහන, ප්‍රාදේශීය සභා නිවාස උප-වැඩසටහන, මහවැලි නිවාස උප-වැඩසටහන, වැවිලි නිවාස උප-වැඩසටහන, රාජ්‍ය නොවන ආයතන නිවාස උප-වැඩසටහන, සේවක නිවාස උප-වැඩසටහන, පුද්ගලික නිවාස උප-වැඩසටහන, පුද්ගලික ආයෝජකයින්ගේ නිවාස උප-වැඩසටහන හා නිවාස සම්පත් සංවර්ධන උප-වැඩසටහන හඳුන්වා දී ඇත.

නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන යටතේ ග්‍රාමීය හා නාගරික අංශයේ අඩු ආදායම් ලබන පවුල් සඳහා නිවාස සැපයීමේ ඍජු වගකීම නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉටු කරන අතර, ඒ සඳහා ග්‍රාමීය නිවාස උප-වැඩසටහන හා නාගරික නිවාස උප-වැඩසටහන යටතේ නිවාස සංවර්ධන කටයුතු සැපයීමට සැලසුම් කර ඇත. මෙම නිවාස උප-වැඩසටහන් දෙක යටතේ පිළිවෙලින් නිවාස 450,000 හා 150,000 ක් 1995 වන විට සැපයීමට ඉලක්ක කර ඇත. මීට අමතරව ස්වාභාවික හෝ පුද්ගල අරගල මත ආපදාවට පත් පවුල්වලට සහ මහ කොළඹ ප්‍රදේශයේ අඩු ආදායම් ලබන පවුල් සඳහා නිවාස ලබාදීම ආපදා නිවාස උප-වැඩසටහන හා සේවක නිවාස උප-වැඩසටහන යටතේ සිදු කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලැබේ. ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අමතරව පුනරුත්ථාපන, ප්‍රති-සංවර්ධන හා සමාජ සුභසාධන, වැවිලි කර්මාන්ත, මහවැලි සහ කම්කරු අමාත්‍යාංශ, පලාත් සභා, සීමාසහිත නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, සමූපකාර, බැංකු, පුද්ගලික ආයෝජකයින් සහ රාජ්‍ය නොවන ආයතන නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සහභාගී වන කොටස්කරුවන් ලෙස හඳුනාගෙන ඇත.

නිවාස ණය සපයන ආයතනයනට මුහුණපෑමට සිදුවූ මූල්‍යමය අවහිරතා, වර්ෂයේ දෙවන භාගයේදී උතුරු හා නැගෙනහිර පලාත්හි පැවති නොසන්සුන් තත්ත්වය හා ගොඩනැගිලි ද්‍රව්‍ය හිඟය වැනි සාධක 1990 වසරේදී නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන කෙරෙහි අයහපත් ලෙසින් බලපානු ලැබීන. කෙසේ වුවද, නිවාස සංවර්ධන අධිකාරිය විසින් 1990 වර්ෂයේදී මෙම නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම පහසු කරවනු පිණිස විවිධ ක්‍රියා මාර්ගයන් හඳුන්වා දෙන ලදී. පලාත් සභා විමධ්‍යගත අයවැයෙන් සහ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්

වලින් මූල්‍ය පහසුකම් ලබාගැනීම මගින් නිවාස සංවර්ධන මූල්‍ය උපයෝගී ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ඒ යටතේ රුපියල් දශ ලක්ෂ 68 ක් පවරා දීමට එකඟ වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 49 ක් 1990 වර්ෂය තුළදී ලබා ගන්නා ලදී. මේ අතර නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන සමාජීය මට්ටමේදී ක්‍රියාත්මක කිරීම පහසුවීම සඳහා නිවාස සංවර්ධන සමූපකාර සමිති පිහිටුවා ගන්නා ලදී. මෙම නිවාස සංවර්ධන සමූපකාර සමිති සෑම ප්‍රාදේශීය සභා කොට්ඨාශයකම පිහිටුවීම මගින් මෙම සමිති සෑම සමාජ කොට්ඨාශයකම ව්‍යාප්ත කිරීමට අදහස් කර ඇත. එසේම අඩු වියදම් ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය හා දේශීය සම්පත් ප්‍රශස්ථ මට්ටමින් උපයෝගී කරගැනීම සඳහා සම්පත් සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මීට අමතරව මෙම නිවාස වැඩසටහන්වල ක්‍රියාකාරිත්වයට විවිධ ආධාරකරුවන් යොමු කරවීම සඳහා පොලීසිය, පූජනීය ස්ථාන, විදුහල්, සේවා වනිතා සංවිධාන, රාජ්‍ය නොවන ආයතන ආදියෙහි සහයෝගය ඇතිව විශේෂ පරිශ්‍රමයක් දරන ලදී.

### 1.27 සංඛ්‍යා සටහන

### නිවාස 15 ලක්ෂයේ වැඩ සටහනෙහි ක්‍රියාකාරිත්වය – 1990

| උප වැඩසටහන | | ණය ලබාගත් පවුල් ගණන | නිමකල ඒකක ගණන | මුදා හරින ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ |
|---|---|---|---|---|
| ග්‍රාමීය නිවාස උප වැඩසටහන | .. | 28,708 | 15,787 | 207·3 |
| නාගරික නිවාස උප වැඩසටහන | .. | 3,983 | 1,493 | 32·6 |
| පලාත් සභා නිවාස උප වැඩසටහන | .. | 1,070 | 127 | 3·9 |
| විපතට පත් නිවාස උප වැඩසටහන | .. | 2,179 | 145 | 24·3 |
| වතුකරයේ නිවාස උප වැඩසටහන* | .. | 300 | නැත | 0·9 |
| මහවැලි නිවාස උප වැඩසටහන | .. | 3,618 | 4,510** | 15·4*** |
| සේවක නිවාස උප වැඩසටහන | .. | 1,010 | 130 | 34·7 |
| මුළු ගණන | .. | 40,367 | 22,192 | 319·1 |

මූලය : ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, මහවැලි ආර්ථික ඒජන්සිය.

* ජනවසම හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අයත් නොවේ.
** මහවැලි ආර්ථික ඒජන්සිය, යුරෝපා ආර්ථික කොමිෂම, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ සහ උප පවුල් විසින් නිම කරන ලද නිවාස.
*** මහවැලි ආර්ථික ඒජන්සිය මගින් නව පදිංචි කරුවන් සඳහා කරන ලද ප්‍රදානයන්.

නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන යටතේ ඇති ග්‍රාමීය නිවාස උප-වැඩසටහන, නාගරික නිවාස උප-වැඩසටහන, ආපදා නිවාස උප-වැඩසටහන, මහවැලි නිවාස උප-වැඩසටහන, ප්‍රාදේශීය සභා නිවාස උප-වැඩසටහන සහ වැවිලි නිවාස උප-වැඩසටහන රාජ්‍ය අංශයේ නිවාස වැඩසටහන් ලෙස වර්ගීකරණය කර ඇත. මෙම නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහනේ විශාලම උප-වැඩසටහන වන ග්‍රාමීය නිවාස උප-වැඩසටහන යටතේ එක් පවුලකට දෙන උපරිම ණය සීමාව රු. 12,500 ට යටත්ව පවුල් 28,708 කට 1990 වර්ෂය තුළදී ණය ලබාදී ඇත. මේ යටතේ නිවාස 15,787 ක් 1990 වර්ෂය අවසාන වන විට තනා නිම කළ අතර, රුපියල් දශ ලක්ෂ 207 ක් මෙම වැඩසටහන යටතේ වියදම් කර ඇත. නාගරික නිවාස උප-වැඩසටහන යටතේ අඩු ආදායම් ලබන පවුල් 3,983 ක් සඳහා රුපියල් 20,000 ක උපරිම ණය සීමාවක් යටතේ ණය ලබා-දෙන ලදී. අදාළ වර්ෂය තුළදී ඉන් නිවාස 1,493 ක් නිම කළ අතර, එම වැඩසටහන යටතේ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 33 ක් විය. ආපදා නිවාස උප-වැඩසටහන යටතේ නිවාස ණය

2,179 ක් ලබාදුන් අතර, නිවාස 145 ක ඉදි කිරීම් කටයුතු අවසන් කරන ලදී. මෙම වැඩසටහන යටතේ දරන ලද මුළු වියදම රුපියල් දශ ලක්ෂ 24 ක් විය. මේ අතර ප්‍රාදේශීය සභා නිවාස උප-වැඩසටහන යටතේ පවුල් 1,070 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 4 ක් ලබාදෙනු ලැබිනි. තවද රුපියල් දශ ලක්ෂ 37 ක් වටිනා නිවාස ඉදි කිරීමට සුදුසු බිම් කැබලි 3,513 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නාගරික නිවාස උප-වැඩසටහන හා පුද්ගලික නිවාස උප-වැඩසටහන යටතේ ලබා දෙන ලදී.

මේ අතර, 1990 වර්ෂයේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සේවක නිවාස උප-වැඩසටහන යටතේ විශේෂ නිවාස ව්‍යාපෘති කීපයක ඉදිකිරීම් කටයුතු භාරගෙන ඇත. කොළඹ නගරයෙහි අඩු ආදායම් ලබන්නන් සඳහා නිවාස පන්දහසේ වැඩසටහනක් ආරම්භ කර ඇති අතර, ඒ සඳහා වන මුළු වියදම රුපියල් දශ ලක්ෂ 1,500 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මේ යටතේ, 1990 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 84 ක ඇස්තමේන්තුගත වියදමක් සහිතව, නිවාස 407 ක් ඉදිකිරීම සඳහා ඉලක්ක කරමින් ව්‍යාපෘති 5 ක් ආරම්භ කරන ලදී. මේ අතර රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා නිවාස ලබාදීමට රුපියල් දශ ලක්ෂ 271 ක ඇස්තමේන්තුගත වියදමක් යටතේ නිවාස 400 න් සමන්විත මැනිං නගර නිවාස ව්‍යාපෘතිය නාරාහේන්පිට ආරම්භ කරන ලදී.

ආසියානු සංවර්ධන බැංකුව සහ ඕලන්ද සහ නෝර්වේජියානු රජයන් විසින් මූල්‍යකරණය කරනු ලබන මධ්‍යකාලීන ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති සමාජ-සුභසාධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද වැවිලි නිවාස උප-වැඩසටහන 1990 වර්ෂයටද දීර්ඝ කරන ලදී. මෙම වැවිලි නිවාස උප-වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යන රාජ්‍ය ආයතන දෙක මගින් සිදුකරන ලද අතර, 1990 වර්ෂය තුළදී මෙම වැඩසටහන යටතේ නිවාස ඉදිකිරීමේ අඩු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මෙයට හේතුව වූයේ වැවිලි ක්ෂේත්‍රයේ පරිපාලනමය අංශයෙහි සිදු කරන ලද වෙනස්කම් නිසා වර්ෂයේ ප්‍රථම භාගය තුළදී නිවාස ඉදිකිරීම් කටයුතුවල සිදුවූ ප්‍රමාදය වේ. තාවකාලික දත්තයනට අනුව 1990 වර්ෂය තුළදී ජනතා වතු සංවර්ධන මණ්ඩලය නව නිවාස 96 ක් හා නිවාස වැඩිදියුණු කිරීම් 180 ක් නිම කරන ලද අතර තවත් නව නිවාස 66 ක හා නිවාස වැඩිදියුණු කිරීම් 204 ක කටයුතු කරමින් පැවතුනි. ඒ හා සමානව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, 1990 වර්ෂය තුළදී නව නිවාස 4 ක් හා නිවාස වැඩි දියුණු කිරීම් 3 ක් නිමකරන ලද අතර, නව නිවාස 36 ක හා නිවාස වැඩිදියුණු කිරීම් 22 ක කටයුතු ඉදිවෙමින් පැවතුණි. එසේම ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිළිවෙලින් නිවාස 2,438 කට හා 5,835 කට වැසිකිළි පහසුකම් ලබාදීම මෙම කාලය තුළදී සිදු කරන ලදී. මීට අමතරව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් වැවිලි අංශයේ පවුල් 300 ක් සඳහා 1990 වර්ෂය තුළදී නිවාස ණය ලබාදෙන ලදී.

මහවැලි නිවාස උප-වැඩසටහන යටතේ, මහවැලි ආර්ථික ඒජන්සිය මගින් එච්, බී, සී, ජී හා එල් කලාපයන්හි පවුල් 3,618 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 15 ක්, නිවාස ඉදිකිරීම සඳහා මූල්‍ය ආධාර වශයෙන් ලබාදෙන ලදී. පදිංචි කරවීම සඳහා තෝරා ගත් සෑම පවුලක් සඳහාම රු. 4,250 ක නිවාස ගොඩනැංවීමේ ආධාරයක් මහවැලි ආර්ථික ඒජන්සිය මගින් ලබාදී ඇත. මෙම වැඩසටහනට අමතරව මහවැලි පදිංචිකරුවන් සඳහා යුරෝපා ආර්ථික හවුල හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ නිවාස ණය ලබාදීමට කටයුතු සම්පාදනය කර තිබුණි. ඒ අනුව යුරෝපීය ආර්ථික හවුල හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ලබාදී තිබූ ණය යටතේ පිළිවෙලින් නිවාස 226 ක හා 72 ක වැඩකටයුතු නිම කිරීම 1990 වර්ෂය තුළදී සිදුවුනි. දැව සහ සිමෙන්ති වැනි ගොඩනැගිලි ද්‍රව්‍යවල පැවති හිඟතාවය නිසා මහවැලි නිවාස උප-වැඩසටහනහි ඉදිකිරීම් කටයුතුවල තරමක පසුබෑමක් මෙම කාලය තුළදී සිදුවුනි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ජාතික නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ලංකා බැංකුව සහ මහජන බැංකුව 1990 වර්ෂයේදී පුද්ගලික අංශයේ නිවාස සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය පහසුකම් සැපයූ රාජ්‍ය අංශයේ ප්‍රධාන මූල්‍ය ආයතනයන් ලෙස

හඳුන්වා දිය හැක. කෙසේ වුවත්, 1990 වර්ෂය තුළදී පොළී ප්‍රතිශත ඉහළ යාම, ගොඩනැගිලි ද්‍රව්‍යවල මිළ ඉහළ යාම සහ හිඟතාවය යන කරුණු පෞද්ගලික අංශයේ නිවාස සංවර්ධන කටයුතුවලට අහිතකර ලෙසින් බලපාන ලදී. ඒ අනුව සමහරක් මූල්‍ය ආයතන පුද්ගලික අංශය සඳහා වඩා සහනදායී කොන්දේසි යටතේ ණය ලබාදීම සඳහා තම නිවාස ණය වැඩසටහන්වල වෙනස්කම්ද සිදුකරන ලදී.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පුද්ගලයින්හට සහ දේපල සංවර්ධකයින්ට නිවාස ණය සපයනු ලබන ප්‍රධානතම මූලාශ්‍රය ලෙස 1990 වර්ෂයේදී ද කටයුතු කරනු ලැබීන. තාවකාලික දත්තයනට අනුව නිවාස ණය 2,643 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 270 ක් 1990 වර්ෂය තුළදී ලබාදී ඇත. කෙසේවුවද, පසුගිය වර්ෂය හා සැසඳීමේදී නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදී ඇති නිවාස ණය සංඛ්‍යාව හා මුළු ණය මුදල පිළිවෙලින් සියයට 9 ක හා සියයට 19 ක ප්‍රමාණයකින් මෙම වර්ෂයේදී අඩු වී ඇත. 1990 වර්ෂය තුළදී සිදුකරන ලද පොළී ප්‍රතිශතයන්හි ඉහළ නැංවීම හා ගොඩනැගිලි ද්‍රව්‍යවල මිළ ඉහළ යාම මෙම අඩුවීම කෙරෙහි විශාල ලෙස බලපාන ලදී. මීට ප්‍රතිවිරුද්ධ ලෙස නිවාස ණය ආපසු අයකර ගැනීම් රුපියල් දශ ලක්ෂ 543 ක් දක්වා සියයට 17 කින් (හිඟව පැවති වාරිකවල ගෙවීම් ද ඇතුළුව) 1990 වර්ෂය තුළදී වැඩිවුනි. මේ අතර පුද්ගලික අංශයේ නිවාස ණය සඳහා ඉල්ලුම වැඩිකිරීම සඳහා නව ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමද 1990 වර්ෂයේදී සිදු කරන ලදී. මේ අනුව 1989 දී අත්හිටුවන ලද පාවිච්චි කරන ලද නිවාස මිළදී ගැනීම සඳහා ණය දීම නැවත හඳුන්වාදීම හා නිවාස අළුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කරගැනීම සඳහා, ණය ලබාදීමටද තීරණය කරන ලදී. මීට අමතරව රාජ්‍ය හා අර්ධ-රාජ්‍ය ආයතනයන්හි සේවකයින්ට කණ්ඩායම් නිවාස ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබූ අතර, එහිදී සේවායෝජකයින් විසින් සපයන ලද අරමුදල් මත සහනදායී පොළී ප්‍රතිශතයන් යටතේ ණය ලබාදීම සිදු කරනු ලැබේ. මේ අතර රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කම්කරු අමාත්‍යාංශයේ අනුග්‍රහය මත සේවක අර්ථසාධක අරමුදල් ණය යෝජනා ක්‍රමය යටතේ නිවාස ණය ලබාදුන් අතර, ඒ සඳහා අර්ථසාධක අරමුදලේ පවතින ශේෂය ඇපයක් ලෙස තබා ගනු ලැබීන.

රාජ්‍ය වාණිජ බැංකු දෙක වන ලංකා බැංකුව හා මහජන බැංකුව නිවාස සංවර්ධනය සඳහා තම ණය යෝජනා ක්‍රම 1990 වර්ෂය තුළදී ද පවත්වාගෙන යන ලදී. ලංකා බැංකුව 1990 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 587 ක් වන නිවාස ණය 1,327 ක් ප්‍රදානය කර ඇත. පසුගිය වර්ෂය හා සැසඳීමේදී ලබාදුන් ණය සංඛ්‍යාව හා ණය මුදල පිළිවෙලින් සියයට 50 ක හා 58 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවද නිවාස ණය ලබාදීම මඟින් නිවාස අංශයට දායක වී ඇත. බැංකුව විසින් 1990 දී නිවාස ණය 591 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 70 ක් ලබාදී ඇති අතර, 1989 වර්ෂයේදී ලබාදී තිබුනේ නිවාස ණය 457 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 56 කි. 1990 වර්ෂය තුළදී නව නිවාස තැනීම සඳහා ලබාදෙනු ලැබූ මුළු ණය මුදල සියයට 20 න් වැඩිවී රුපියල් දශ ලක්ෂ 35 ක් විය. නිවාස ණය මුදල් සඳහා අය කරන ලද පොළී ප්‍රතිශතය සියයට 18 සිට 22 දක්වා වෙනස් වූ අතර එය ණය මුදලේ ප්‍රමාණය හා ණය මුදල, ලබාගනු ලැබූ කාර්‍ය්‍යය මත තීරණය කරනු ලැබීය.

සීමාසහිත ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව නිවාස කටයුතු සඳහා සීමිත පරිමාණයක් යටතේ ණය ලබාදීම සිදුකරන ලදී. 1990 වර්ෂය තුළදී නිවාස කටයුතු සඳහා ලබාදුන් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12 ක් වූ අතර, 1989 දී එය රුපියල් දශ ලක්ෂ 11 ක් විය. මෙම මන්දගාමී වර්ධනයට ප්‍රධාන හේතුව වූයේ ණය ලබාදීම සඳහා තිබූ අරමුදල් ප්‍රමාණවත් නොවීමයි. කොළඹින් පිටත ප්‍රදේශවලට මෙම ණය මුදල් සැපයීමේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෙම බැංකුවේ ශාඛා දිස්ත්‍රික් ඒකක ලෙස පිහිටුවීමට දිස්ත්‍රික්ක 7 ක් තෝරාගැනීම සිදු කරන ලදී. මේ යටතේ දිස්ත්‍රික් ඒකක 2 ක් මහනුවර හා මාතර විවෘත කරන ලදී. 1990 වර්ෂය තුළදී මෙම බැංකුව මඟින් ලබාදුන් නිවාස ණය සඳහා අය කළ පොළිය සියයට 19 කි.

මේ අතර නිවාස දශ ලක්ෂයේ වැඩසටහනේ කටයුතු 1990 වර්ෂයේදී ද පවත්වාගෙන යන ලදී. මේ යටතේ 1990 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 37 ක් ලබා දුන් අතර, ග්‍රාමීය නිවාස උප-වැඩසටහන, නාගරික නිවාස උප-වැඩසටහන හා පුනරුත්ථාපන වැඩසටහන් යටතේ නිවාස 13,732 ක කටයුතු නිම කරන ලදී. මීට අමතරව සෙවන නිවාස වැඩපිළිවෙල යටතේ නිවාස 5,176 ක් ඉදිකිරීම සඳහා ග්‍රාමීය හා නාගරික අංශයේ දුප්පත් පවුල් අතර රුපියල් දශ ලක්ෂ 8 ක් බෙදා දෙන ලදී. මීට අමතරව රුපියල් දශ ලක්ෂ 3.9 ක් වටිනා ග්‍රාමීය නිවාස 197 ක හිමිකම් පවරා දීමද 1990 වර්ෂයේදී සිදු කරන ලදී.

## නාගරික සංවර්ධනය

1990 වර්ෂය තුළදී නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කරන ලද නාගරික සංවර්ධන කටයුතුවල වර්ධනයක් දක්නට ලැබුණි. වසර තුළදී, නාගරික සංවර්ධන අධිකාරිය සමාජීය හා සංස්කෘතික කටයුතු පිළිබඳ ව්‍යාපෘති කෙරෙහි වැඩි අවධානය යොමු කරනු ලැබිනි. සුගතදස ගෘහස්ථ ක්‍රීඩාංගනය ගොඩ නැංවීමේ කටයුතු සඳහා දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 135 ක් මෙම වර්ෂය තුළදී වැය කර ඇත. ඊට අමතරව රුපියල් දශ ලක්ෂ 50 ක්, බෙත්තාරාම ක්‍රීඩාංගනය වැඩි දියුණු කිරීමේ කටයුතු සඳහා වැය කරන ලදී. මේ අතර රුපියල් දශ ලක්ෂ 25 ක් හෝමාගම කාර්මික සංවර්ධන ව්‍යාපෘතියෙහි යටිතළ පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා වැය කරන ලදී. පැලියගොඩ ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රථම අදියර යටතේ විකිණිය හැකි ඉඩම්වලින් සියයට 90 ක් 1990 වර්ෂය අවසානය වන විට බදු දෙන ලද අතර, පවුල් නැවත පදිංචි කරවීම සඳහා නිවාස 136 ක ගොඩ නැංවීමේ කටයුතු ආරම්භ කරන ලදී.

1990 වර්ෂයේදී නාගරික සංවර්ධන කටයුතු සඳහා වැය වූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 315 ක් වූ අතර, 1989 වර්ෂයේ දී වියදම රුපියල් දශ ලක්ෂ 154 ක් විය. එම වියදම් කරන ලද මුළු මුදලින් රුපියල් දශ ලක්ෂ 135 ක් සමාජ හා සංස්කෘතික ව්‍යාපෘති සඳහා යොදවන ලද අතර, රුපියල් දශ ලක්ෂ 75 ක් අනුග්‍රාහකයන් වෙනුවෙන් භාරගත් ව්‍යාපෘති සඳහා වැය කරන ලදී. මේ අතර ඉඩම් බැංකුව විසින් මිළදී ගන්නා ලද සංවර්ධනය නොකරන ලද හා මුදු ඉඩම් සඳහා රුපියල් දශ ලක්ෂ 51 ක් වැය කරන ලදී. මීට අමතරව ඒකාබද්ධ හා කාර්මික සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් දශ ලක්ෂ 44 ක් වැය කරන ලදී. ණයවර කොටස් නිකුත් කිරීම හා අභ්‍යන්තර අරමුදල් ජනනය කරගැනීම මගින් මුළු ආයෝජනයෙන් සියයට 76 ක් මූල්‍යකරණය කරන ලද අතර ඉතිරි ප්‍රමාණය අනුග්‍රාහකයන් විසින් සපයන ලදී.

## මහාමාර්ග සහ දුම්රිය මාර්ග

පසුගිය වර්ෂය හා සැසඳීමේදී 1990 දී මාර්ග සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරිත්වයේ වැඩිදියුණුවක් දක්නට ලැබුණි. පුපුරණ ද්‍රව්‍ය නොමැතිවීම සහ කොන්ත්‍රාත් කරුවන්ගේ හිඟකමත්, උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි අභ්‍යන්තර නොසන්සුන් තත්ත්වයත්, මාර්ග සංවර්ධන වැඩකටයුතු කෙරෙහි යම් ප්‍රමාණයක බලපෑම් ඇති කළද මාර්ග පද්ධතියේ ප්‍රතිසංවිධාන වැඩකටයුතුවල ප්‍රගතියක් විමර්ශනයට ලක්වන වර්ෂයේදී දක්නට ලැබුණි.

1990 අවසාන වනවිට ලෝක බැංකුවේ දෙවැනි මහාමාර්ග ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද වැඩකටයුතු අතර කොළඹ-මහනුවර මහාමාර්ගයේ වරකාපොල සිට මහනුවර දක්වාද, කොළඹ-හොරණ මහාමාර්ගයේ පැපිලියාන සිට හොරණ දක්වාද, කඩවත-වැලිසර මහා මාර්ගයේ ද ප්‍රතිසංස්කරණ වැඩකටයුතු විය. වර්ෂය තුළදී ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ මාතලේ-දඹුල්ල-හබරණ මාර්ගයේ ප්‍රතිසංවිධාන වැඩකටයුතු නිමකළ අතර, ඕමාරගොල්ල-දඹුල්ල-අනුරාධපුර මහාමාර්ගයේ වැඩකටයුතුවල ප්‍රගතියක් දක්නට ලැබුණි. මේ අතර, ජපන් ආධාර යටතේ කරගෙන යනු ලබන වික්ටෝරියා පාලමෙහි ඉදිකිරීම් කටයුතුවල ද දියුණුවක් වාර්තා විය.

1990 වර්ෂයේදී මහාමාර්ග අමාත්‍යාංශය සහ පළාත්සභා මගින් නඩත්තු කරන ලද මහාමාර්ග පද්ධතිය කිලෝමීටර් 25,749 ක් වූ අතර, මහාමාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත් සභා මගින් නඩත්තු කරන ලද පාලම් සංඛ්‍යාව 5,477 ක් විය. මෙම වර්ෂයේදී මාර්ග සංවර්ධන කටයුතු සඳහා වියදම් කළ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 1,075 කි. මෙය පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 32 ක වැඩිවීමක් පෙන්වයි. මහාමාර්ග නඩත්තු කිරීමේදී දැරීමට සිදුවූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 178 ක් විය.

කිලෝමීටර් 1,944 ක්වූ දුම්රිය මාර්ග පද්ධතිය 1989 වර්ෂයේදී මෙන්ම 1990 වර්ෂයේදී ද නොවෙනස්ව පැවතුණි. කොන්ක්‍රීට් සිල්බර කඳන් නිපදවීමේ කර්මාන්තායතනයේ නිෂ්පාදන කටයුතු 1990 පෙබරවාරි මාසයේදී ආරම්භ කළ අතර මෙම සිල්බර කඳන් ප්‍රධාන සහ වෙරළබඩ දුම්රිය මාර්ග නඩත් තු කිරීමේ කටයුතු වලදී භාවිතා කර ඇත.

## පණිවුඩ හුවමාරු සේවා

1990 දී රටේ ආරක්ෂක තත්ත්වය යහපත්වීමත් සමඟ තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවල කටයුතු සැළකිය යුතු පරිදි වැඩිදියුණු විය.

වර්ෂය තුළදී මෙහෙයවන ලද දේශීය තැපැල් සහ පාර්සල් සංඛ්‍යාව වැඩිවීම නිසා 1989 දී දශ ලක්ෂ 488 ක්ව පැවති තැපැල් දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ලද තැපැල් භාණ්ඩ සංඛ්‍යාව 1990 දී දශ ලක්ෂ 519 දක්වා ඉහළ ගියේය. 1990 දී මෙහෙය වූ දේශීය තැපැල් ලිපි සංඛ්‍යාව දශ ලක්ෂ 446 ක් දක්වා සියයට 9 කින්ද, දේශීය පාර්සල් සංඛ්‍යාව 590,000 ක් දක්වා සියයට 5 කින්ද වැඩි විය. මේ අතර, පසුගිය වර්ෂය සමඟ සසඳන විට විදේශීය තැපැල් ලිපි සංඛ්‍යාව 72,382 ක් දක්වා සියයට 5 කින් අඩු වූ අතර, විදේශ පාර්සල් සංඛ්‍යාව 71,000 ක ප්‍රමාණයක නොවෙනස්ව පැවතුණි.

1989 දී 3,908 ක් වූ තැපැල් කාර්යාල පද්ධතිය 1990 දී 3,945 ක් දක්වා පුළුල් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1989 දී වර්ග කිලෝමීටර් 16.8 ක්ව තිබූ එක් තැපැල් කාර්යාලයකින් සේවාව සපයනු ලබන භූමි ප්‍රමාණය 1990 දී වර්ග කිලෝමීටර් 16.6 ක් දක්වා පහත වැටිණි. තැපැල් සේවාව මහජනතාව සඳහා කොතරම් සුලභ සහ පහසු සේවාවක් බවට පත්විද යන්න මෙයින් පැහැදිලි වේ. මේ අතර, 1989 දී 28 ක් වූ එක් පුද්ගලයකු ලද තැපැල් ලිපි සංඛ්‍යාව 1990 දී 29 ක් දක්වා වැඩි විය.

1990 දී පවත්නා විදුලි සංදේශ පද්ධතිය පුළුල් කිරීමේ, වැඩිදියුණු කිරීමේ සහ ප්‍රතිසංවිධානය කිරීමේ කටයුතු මගින් විදුලි සංදේශ අංශයේ කටයුතු තවදුරටත් දියුණු කරන ලදී. වර්ෂය තුළදී ක්‍රියාත්මක වූ ප්‍රධානතම ව්‍යාපෘති අතර කොළඹ ප්‍රදේශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ සිව්වෙනි අදියර, විදුලි සංදේශ සේවාවේ සාමාන්‍ය සංවර්ධන කටයුතුද, මහ කොළඹ ප්‍රදේශයේ විදුලි සංදේශ පද්ධතිය වැඩිදියුණු කිරීමේ කටයුතු, අග්නිදිග ආසියා මැද පෙරදිග බටහිර යුරෝපා සබ්මැරින් සංදම (SEA – ME – WE) ව්‍යාපෘතිය සහ ග්‍රාමීය හුවමාරු මධ්‍යස්ථානවලට ගුවන් විදුලි පණිවුඩ මගින් ක්‍රියාකර විය හැකි සන්ධි පරිපථ සැපයීමේ කටයුතු ද විය. 1990 අවසාන වනවිට කොළඹ ප්‍රදේශය සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙලේ සිව්වැනි අදියරයේ සහ අග්නිදිග ආසියා මැදපෙරදිග බටහිර යුරෝපා සබ්මැරින් සංදම ව්‍යාපෘතියේ පළමු වැනි අදියරයේ වැඩකටයුතු නිම කළ අතර, මහ කොළඹ ප්‍රදේශයේ විදුලි සංදේශ ව්‍යාපෘතියේ සහ විදුලි සංදේශ පුහුණු මධ්‍යස්ථානයේ වැඩකටයුතු වලින් විශාල කොටසක්ද සම්පූර්ණ කර තිබුණි. මේ අතර, පින්ලන්ත රජයේ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වන මාතර දිස්ත්‍රික්කයේ විදුලි සංදේශ සේවා පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ වැඩකටයුතු වලින් සැහෙන ප්‍රමාණයක්ද 1990 වර්ෂය තුළදී නිමකර ඇත.

## 1.28 සංඛ්‍යා සටහන

### තැපැල් සහ විදුලි සංදේශ සේවාවේ වර්ධනය 1987 – 1990

| | 1987 | 1988 | 1989 | 1990* |
|---|---|---|---|---|
| 1. තැපැල් සේවය | | | | |
| 1·1 තැපැල් බෙදීමේ කොට්ඨාශ ගණන .. | 6,621 | 6,621 | 6,630 | 6,636 |
| 1·2 තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ප්‍රදේශය (වර්ග කි. මී.) .. | 17·4 | 17·0 | 16·8 | 16·6 |
| 1·3 තැපැල් කාර්යාල සංඛ්‍යාව .. | 3,778 | 3,869 | 3,908 | 3,945 |
| 1·3·1 රාජ්‍ය අංශය .. | 3,757 | 3,829 | 3,841 | 3,864 |
| 1·3·2 පෞද්ගලික අංශය .. | 21 | 40 | 67 | 81 |
| 1·4 තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ජන සංඛ්‍යාව .. | 4,335 | 4,306 | 4,406 | 4,398 |
| 1·5 එක් පදිංචිකරුවෙකුට ලැබුණු ලිපි ගණන .. | 35 | 32 | 28 | 29 |
| 2. විදුලි සංදේශ සේවය | | | | |
| 2·1 දේශීය දුරකථන සේවය | | | | |
| 2·1·1 දුරකථන සංඛ්‍යාව .. | 97,832 | 104,208 | 105,007 | 115,248 |
| 2·1·2 අළුතින් දෙනු ලැබූ දුරකථන සංඛ්‍යාව .. | 5,073 | 5,000 | 6,087 | 10,241 |
| 2·1·3 පොරොත්තු ලේඛණයේ සිටින ගණන .. | 27,016 | 50,994 | 48,400 | 38,000 |
| 2·1·4 දුරකථන සඳහා ඉල්ලුම (සංඛ්‍යාව) .. | 124,848 | 155,202 | 153,407 | 153,248 |
| 2·1·5 දුරකථන ඝනත්වය (පුද්ගලයින් 100 කට දුරකථන ගණන) .. | 0·59 | 0·62 | 0·62 | 0·68 |
| 2·2 විදේශ විදුලි සංදේශ සේවය | | | | |
| 2·2·1 ටෙලෙක්ස් සම්බන්ධක ගණන .. | 1,378 | 1,535 | 1,591 | 1,662 |
| 2·2·2 පොරොත්තු ලේඛණයේ සිටින ගණන .. | 135 | 127 | 59 | 54 |
| 2·2·3 එතෙර ඇමතුම් (සංඛ්‍යාව) | | | | |
| 2·2·3·1 එතෙර දුරකථන මෙහෙයවුම් (අ) .. | 6,376,372 | 6,980,022 | 8,038,000 | 9,006.000 |
| 2·2·3·2 එතෙර විදුලි පණිවිඩ (ආ) .. | 3,726,913 | 3,359,723 | 3,023,000 | 2,720,000 |
| 2·2·3·3 එතෙර ටෙලෙක්ස් මෙහෙයවුම් (අ) .. | 4,854,422 | 4,824,658 | 4,777,000 | 4,730,000 |

(අ) සංඛ්‍යා දක්වෙන්නේ මිනිත්තු වලිනි

(ආ) සංඛ්‍යා දක්වෙන්නේ වචන වලිනි

* තාවකාලික

මූලයන්: තැපැල් දෙපාර්තමේන්තුව,
විදුලි සංදේශ දෙපාර්තමේන්තුව.

මෙම විශේෂ ව්‍යාපෘතිවලට අමතරව දිවයිනේ සාමාන්‍ය විදුලි සංදේශ සේවා සංවර්ධනය කිරීම සඳහා පියවර කිහිපයක් ගනු ලැබින. ඒ අනුව, 1990 දී මහජනතාව වෙත සපයන ලද මුළු දුරකථන සංඛ්‍යාව 115,248 ක් දක්වා සියයට 10 කින් ඉහළ ගොස් ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1989 දී 48,400 ක්වූ නව දුරකථන සඳහා අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව 1990 දී 38,000 ක් දක්වා පහත වැටිණි. මේ අතර, මුළු ටෙලෙක්ස් සම්බන්ධක ගණන 1990 දී 1,662 ක් දක්වා සියයට 4 කින් වැඩි විය. 1990 වර්ෂයේදී එතෙර දුරකථන මෙහෙයවුම් සියයට 12 කින් වැඩි වූ අතර එතෙර විදුලි පණිවිඩ සහ ටෙලෙක්ස් මෙහෙයවුම් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 10 කින් සහ සියයට 1 කින් අඩු වී ඇත.

## ජනසවිය වැඩසටහන

රජය විසින් අනුගමනය කරනු ලබන දුගී බව තුරන් කිරීමේ උපාය මාර්ගයෙහි එක් අංගයක් ලෙසින් 1989 අවසාන කාර්තුවේදී ජනසවිය වැඩසටහන දියත් කරනු ලැබින. ජනසවිය වැඩසටහන වට 11 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇති අතර, එහි පළමු වටය 1989 ඔක්තෝබර් මස සිට 1991 සැප්තැම්බර් දක්වා ක්‍රියාත්මක වේ. මේ අනුව මූලික අවශ්‍යතාවයක් ලෙස දශ ලක්ෂ 2.3 වන සියළුම ආහාර මුද්දරලාභී පවුල් අතර 1989 ජූනි මස 29 වන දින ජනසවිය හිමිකම් සහතිකපත් බෙදා දෙන ලදී. මෙම සහතිකපත් බෙදා දීමේදී ජනසවිය ලබා ගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් තිබේද යන්න නොසලකන ලද අතර, එම සහතිකපත් ජනසවිය පහසුකම් ලබා ගැනීමට ප්‍රවේශවීමේ සාක්ෂියක් ලෙස හඳුන්වා ඇත. ජනසවිය පහසුකම් ලබාදීම සඳහා සුදුසු පවුල් හඳුනා ගැනීම අදාළ සමාජ කොට්ඨාශ මගින් විවෘත ක්‍රමයකට සිදු කරනු ලබන අතර, එහිදී රාජ්‍ය නිලධාරින්ගේ මැදිහත්වීමක් සිදු නොවේ. පවුල් හඳුනාගැනීමේ එකම නිර්නායකය ලෙස මාසික කුටුම්බ ආදායම සළකනු ලබන අතර, මාසික කුටුම්බ ආදායම රු. 700/– ට වඩා අඩු පවුල් මෙම පහසුකම් සඳහා තෝරා ගනු ලැබේ.

හඳුනාගත් සෑම පවුලකටම පරිභෝජන හා ආයෝජන කටයුතු සඳහා මාසිකව රුපියල් 2,500 ක් වටිනා සම්පත් මාස 24 ක කාලයක් සඳහා ලබාදෙනු ලැබේ. මූලික වශයෙන් රුපියල් 1,458 ක් පරිභෝජනය සඳහා වෙන් කරනු ලබන අතර, ඉන් රුපියල් 1000 ක් සෘජුවම පරිභෝජනය සඳහා ලබාදෙනු ලැබේ. ඉතිරි මුදල කුටුම්බයෙහි ඉතිරි කිරීමේ ගිණුමට බැර කරනු ලැබේ. මෙම ඉතුරුම් පරිභෝජන කටයුතු සඳහා අවශ්‍ය ඕනෑම විටක ලබාගත හැකි වේ. ඉතිරි රුපියල් 1,042 මාසිකව ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි ජනසවි ලාභීන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමෙහි තැන්පත් කරනු ලැබේ.

1989 ඔක්තෝම්බර් මස ආරම්භ කරන ලද ජනසවිය ප්‍රථම වටයේ කටයුතු දිස්ත්‍රික්ක 25 තුල උප දිසාපති කොට්ඨාශ 28 ක ක්‍රියාත්මක කරන ලදී. අදාළ කොට්ඨාශයේ ජනගහනයෙන් ආහාර මුද්දරලාභීන් වැඩිම ප්‍රතිශතයක් සිටින උප දිසාපති කොට්ඨාශ ප්‍රථම වටය සඳහා තෝරා ගන්නා ලදී. ප්‍රථම වටය ආරම්භ කරන අවස්ථාවේ දී පවුල් 188,169 ක් ජනසවිය පහසුකම් ලබාදීම සඳහා හඳුනා ගන්නා ලද නමුත් නොකඩවා සිදු කරනු ලබන නුසුදුසු පුද්ගලයින් ඉවත් කිරීමේ කටයුතු නිසා 1990 අවසානය වන විට පවුල් සංඛ්‍යාව 156,245 දක්වා පහත බැස තිබුණි. මාසික කුටුම්බ ආදායම රුපියල් 700 ට වැඩි ආදායම් ලබන පවුල් හා තම ශ්‍රමය ජනසවිය සඳහා ලබා නොදුන් පවුල් නොකඩවා ඉවත් කිරීම මෙම කාලය තුලදී සිදු කරන ලදී.

ජනසවිය වැඩසටහන යටතේ ඇති පරිභෝජන උප වැඩසටහන මීට පෙර තිබූ ආහාර මුද්දර වැඩසටහනට බොහෝ දුරට සමාන වන නමුත් මෙම වැඩසටහන යටතේ දේශීයව නිෂ්පාදනය කරන ලද ආහාර හෝ ආහාරමය නොවන ද්‍රව්‍ය පමණක් අදළ සමුපකාර ප්‍රාදේශික හෝ බලයලත් වෙළඳුන්ගෙන් ජනසවි පහසුකම් ලබන්නන් විසින් මිළදී ගත යුතු වේ. ජනසවිලාභීනට මෙම භාණ්ඩ අතරින් කැමති භාණ්ඩ තෝරා ගැනීමේ අවස්ථාව ලබා දී ඇත. මෙහිදී වැඩිම ඉල්ලුමක් සහල් සහ සීනි සඳහා පැවති අතර, අනෙකුත් ආහාර ද්‍රව්‍ය සඳහා අඩු

ඉල්ලුමක් පැවතුණි. මීට අමතරව, පරිභෝජනය සඳහා වෙන් කරනු ලැබූ වියදමින් සැළකිය යුතු ප්‍රමාණයක් පොහොර හා කෘෂිකාර්මික උපකරණ මිළදී ගැනීම සඳහා වියදම් කර තිබුණි. 1990 වර්ෂය අවසානයේ දී ජනසවිය ප්‍රථම වටය සඳහා රුපියල් දශ ලක්ෂ 2,757 ක් වියදම් කර ඇති අතර පරිභෝජනය සඳහා වෙන් කරන ලද මුදලින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි තැන්පත් කර තිබූ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 525 ක් විය.

ජනසවිය වැඩසටහන යටතේ, තෝරාගත් සෑම පවුලක්ම මාසිකව ශ්‍රම ඒකක 24 ක් ලබාදිය යුතු වේ. මෙම ශ්‍රමය බොහෝ විට තාර නොදමන ලද මාර්ග පළල් කිරීම, මාර්ග පුනරුත්ථාපනය කිරීම, වාරිමාර්ග පුනරුත්ථාපනය වැනි යටිතල පහසුකම් දියුණු කිරීමට උපයෝගී කරගනු ලැබිනි. මීට වැඩිමනත්ව ජනසවිය ලාභීන්ට විවිධ ශිල්පීය නිපුණතාවයන් ලබාදීම සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. එමගින් දැනට පවතින ව්‍යාපෘති වැඩි දියුණු කිරීම හා නව ව්‍යාපෘති හෝ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දේ. 1990 වර්ෂය අවසාන වන විට රාජ්‍ය ආයතනයන්හි විවිධ පුහුණු කිරීමේ මධ්‍යස්ථාන මගින් ජනසවිලාභීන් 22,500 ක් පුහුණු කර ඇත. මීට අමතරව ජනසවිය ප්‍රථම වටය තුලදී නව ව්‍යාපෘති 28,598 ක් විවිධ අංශයන්හි ආරම්භ කරන ලද අතර ඒවායින් 17,764 ක් කෘෂිකර්මය, 5,704 ක් කර්මාන්ත, 4,068 ක් වෙළෙඳ හා 1,162 ක් සේවා ව්‍යාපෘති ද විය. එහි ප්‍රතිඵලයක් ලෙස ජනසවිලාභී පවුල් 28,990 ක් මෙම ව්‍යාපෘති හා සම්බන්ධ වී කටයුතු කළ අතර එමගින් නව රැකියා අවස්ථා 38,132 ක් 1990 අවසානය වන විට ජනනය කර තිබුණි.

විවිධ මූල්‍ය ආයතන විවිධ ආදායම් ජනනය කිරීමේ කටයුතු සඳහා සුරකුම් රහිතව ජනසවිලාභීනට ණය ලබාදෙන ලදී. මූල්‍ය ආයතන මගින් ජනසවිලාභීන් 18,359 දෙනෙක් සඳහා රුපියල් දශ ලක්ෂ 132 ක් (ලංකා බැංකුව—පවුල් 6,106 සඳහා රුපියල් දශ ලක්ෂ 48, මහජන බැංකුව—පවුල් 5,733 සඳහා රුපියල් දශ ලක්ෂ 44, සමුපකාර ග්‍රාමීය බැංකු—පවුල් 5,257 සඳහා රුපියල් දශ ලක්ෂ 33, අනෙකුත් බැංකු—පවුල් 1,263 සඳහා රුපියල් දශ ලක්ෂ 7) 1990 වර්ෂයේ අවසානය වන විට ලබා දෙන ලදී. මීට අමතරව ලෝක බැංකු සහයෝගිතා වැඩසටහන යටතේ, 1990 වසර අවසානයේදී ජනසවිය භාරකාර අරමුදල ස්ථාපනය කරන ලද අතර එමගින් විශේෂයෙන් ජනසවිලාභීන් සඳහා මූල්‍යමය සහ ශිල්පීය නිපුනතා දියුණු කර ගැනීම පිණිස ආධාර සැපයීමට අපේක්ෂා කෙරේ.

ජනසවිය දෙවන වටය 1990 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර ඒ සඳහා දිස්ත්‍රික්ක 25 න් උප දිසාපති කොට්ඨාශ 30 ක් තෝරා ගන්නා ලදී. එහිදී ජනසවිලාභීන් හඳුනා ගැනීමේ ප්‍රථම අදියර යටතේ පවුල් 52,840 ක් ද, (යාපනය, මන්නාරම, වවුනියාව, මුලතිව්, කිලිනොච්චි සහ ත්‍රිකුණාමලය උප දිසාපති කොට්ඨාශ හැර) ජනසවිය දෙවන අදියර යටතේ තවත් පවුල් 26,420 ක් ද වශයෙන් ජනසවිය දෙවන වටය සඳහා පවුල් 77,260 ක් හඳුනාගෙන ඇත.

**කඩිනම් මහවැලි වැඩපිළිවෙල[1]**

ඉදි කිරීම් කටයුතු බොහොමයක් අවසන් වී තිබූ හෙයින්, 1990 වර්ෂයේදී කඩිනම් මහවැලි වැඩපිළිවෙල මගින් මූලික අවධානය යොමු කරන ලද්දේ පහළ ඇල සංවර්ධනය සහ පවුල් පදිංචි කරවීමේ වැඩ කටයුතු කෙරෙහිය. 1989 වර්ෂයෙහිදී ඉදිකිරීමේ කටයුතු සහ පදිංචි කරවීමේ කාර්යයන් පසුබෑස්මකට ලක් වුවද, 1990 දී සිවිල් කළබල අඩුවීමත් සමඟ එම කටයුතු සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, 'බී' කලාපයෙහි (දකුණ ඉවුර) පැවති අස්ථාවර තත්ත්වයන් හේතුවෙන් එම කලාපයෙහි වැඩ කටයුතු තාවකාලිකව අත්හිටුවා තිබුණි. 1990 වර්ෂය තුල මහවැලි කඩිනම් වැඩපිළිවෙල සඳහා වැය වූ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 1,960 ක් විය. එයින් රුපියල් දශ ලක්ෂ 1,177 ක් හෙවත් සියයට 60 ක් වැය කරන ලද්දේ කලාප : 'සී' කලාපය (රුපියල් දශ ලක්ෂ 582), 'බී' කලාපය (රුපියල් දශ ලක්ෂ 537) සහ 'එල්' කලාපය (රුපියල් දශ ලක්ෂ 58) සංවර්ධන වැඩකටයුතු සඳහාය.

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ලැබුණ තොරතුරු මත පදනම් වේ.

## 1.29 සංඛ්‍යා සටහන

### මහවැලි සංවර්ධන වැඩපිළිවෙල යටතේ වගාකළ අළුත් ඉඩම් ප්‍රමාණය

හෙක්ටයාර

| ශීර්ෂය | මහ 1986/87 | යල 1987 | එකතුව 1987 | මහ 1987/88 | යල 1988 | එකතුව 1988 | මහ 1988/89 | යල 1989 | එකතුව 1989 | මහ 1989/90 (අ) | යල 1990 (අ) | එකතුව 1990 (අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 'එච්' කලාපය .. | 24,913 | 9,661 | 34,574 | 24,847 | 12,830 | 37,677 | 19,076 | 4,137 | 23,213 | 30,866 | 18,468 | 49,334 |
| වී .. | 23,317 | 3,295 | 26,612 | 23,560 | 3,951 | 27,511 | 17,360 | 1,455 | 18,815 | 27,893 | 7,594 | 35,487 |
| අනෙකුත් බෝග .. | 1,596 | 6,366 | 7,962 | 1,287 | 8,879 | 10,166 | 1,716 | 2,682 | 4,398 | 2,973 | 10,874 | 13,847 |
| 'බී' කලාපය .. | 5,902 | 5,952 | 11,854 | 6,241 | 6,413 | 12,654 | 9,014 | 9,306 | 18,320 | 12,933 | 10,565 | 23,498 |
| වී .. | 5,120 | 5,626 | 10,746 | 5,850 | 5,945 | 11,795 | 8,688 | 8,669 | 17,357 | 12,207 | 9,721 | 21,928 |
| අනෙකුත් බෝග .. | 782 | 326 | 1,108 | 391 | 468 | 859 | 326 | 637 | 963 | 726 | 844 | 1,570 |
| 'සී' කලාපය .. | 9,865 | 9,588 | 19,453 | 13,362 | 11,219 | 24,581 | 13,105 | 12,768 | 25,873 | 17,352 | 14,730 | 32,082 |
| වී .. | 9,258 | 9,480 | 18,738 | 11,618 | 11,155 | 22,773 | 11,565 | 12,409 | 23,974 | 14,085 | 14,274 | 28,359 |
| අනෙකුත් බෝග .. | 607 | 108 | 715 | 1,744 | 64 | 1,808 | 1,540 | 359 | 1,899 | 3,267 | 456 | 3,723 |
| 'ජී' කලාපය .. | 4,033 | 4,120 | 8,153 | 4,243 | 3,613 | 7,856 | 4,381 | 3,825 | 8,206 | 4,836 | 3,582 | 8,418 |
| වී .. | 3,805 | 2,285 | 6,090 | 3,830 | 1,740 | 5,570 | 4,104 | 1,842 | 5,946 | 4,546 | 2,350 | 6,896 |
| අනෙකුත් බෝග .. | 228 | 1,835 | 2,063 | 413 | 1,873 | 2,286 | 277 | 1,983 | 2,260 | 290 | 1,232 | 1,522 |
| 'එල්' කලාපය .. | — | — | — | — | — | — | — | — | — | 512 | 544 | 1,056 |
| වී .. | — | — | — | — | — | — | — | — | — | 315 | 138 | 453 |
| අනෙකුත් බෝග .. | — | — | — | — | — | — | — | — | — | 197 | 406 | 603 |
| එකතුව .. | 44,713 | 29,321 | 74,034 | 48,693 | 34,075 | 82,768 | 45,576 | 30,036 | 75,612 | 66,499 | 47,889 | 114,388 |

(අ) තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

1990 වර්ෂය තුලදී, කඩිනම් මහවැලි වැඩපිළිවෙල යටතේ ගැනෙන ජල විදුලිබල ව්‍යාපෘතීන්: වික්ටෝරියා (ගිගවොට් පැය 611), කොත්මලේ (ගිගවොට් පැය 420), රන්දෙණිගල (ගිගවොට් පැය 332) සහ රන්ටැඹේ (ගිගවොට් පැය 98) මගින් ගිගවොට් පැය 1,461 ක විදුලි බල ප්‍රමාණයක් උත්පාදනය කෙරුණි. මෙය පසුගිය වර්ෂයෙහි කඩිනම් මහවැලි වැඩපිළිවෙල යටතේ උත්පාදනය කරන ලද මුළු විදුලිබල ප්‍රමාණයට වඩා සියයට 13 ක වැඩිවීමක් දක්වමින් ජාතික බල ශක්ති උත්පාදනයෙන් සියයට 46 කට දයක විය.

මහවැලි අධිකාරිය විසින් සපයනු ලැබූ තාවකාලික දත්තයන්ට අනුව, මහවැලි බල ප්‍රදේශය තුල වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, පසුගිය වර්ෂය සමග සසඳා බලන කල හෙක්ටයාර 114,388 දක්වා සියයට 51 කින් වැඩිවී ඇත. මහවැලි බල ප්‍රදේශය තුල 1989/90 මහ කන්නයේදී හෙක්ටයාර 66,499 ක ප්‍රදේශයක් වගා කල අතර, එය පසුගිය වසරේ අදළ කන්නය සමග සසඳන කල සියයට 46 ක වර්ධනයක් පෙන්වයි. වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙහි වැඩිවීමෙන් සියයට 95 කට දයක වූයේ 'එච්', 'බී' සහ 'සී' යන කලාපයන් ය. කඩිනම් මහවැලි වැඩපිළිවෙල යටතේ 'එල්' කලාපයෙහි වගා කටයුතු 1989/90 මහ කන්නයේදී ආරම්භ විය. 1990 යල කන්නයෙහිදී මහවැලි බල ප්‍රදේශය තුල වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 47,889 දක්වා සියයට 59 කින් සැලකිය යුතු ලෙස වැඩිවිය. 1990 යල කන්නයේදී 'එච්' කලාපය තුල වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 18,468 ක් දක්වා සිවු ගුණයකට වඩා ඉහළ නැඟුණි. 'බී' සහ 'සී' කලාපවල වගා කරන ලද බිම් ප්‍රමාණයන්හිද සැලකිය යුතු වැඩිවීමක් වාර්තා විය. එසේ වුවද, 1990 යල කන්නයෙහිදී 'ජී' කලාපයෙහි වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 3,582 දක්වා සියයට 6 කින් පහත වැටුණි.

### 1.30 සංඛ්‍යා සටහන

### මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ පවුල් පදිංචි කිරීම ('එච්' 'සී' 'බී' 'ජී' සහ 'එල්' කලාප)

පවුල් සංඛ්‍යාව

| වර්ෂය / ප්‍රදේශය | 'එච්' | 'සී' | 'බී' | 'ජී' | 'එල්' | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1975 .. | — | — | — | — | — | — |
| 1976 .. | 2,383 | — | — | — | — | 2,383 |
| 1977 .. | 3,141 | — | — | — | — | 3,141 |
| 1978 .. | 2,754 | — | — | — | — | 2,754 |
| 1979 .. | 5,290 | — | — | — | — | 5,290 |
| 1980 .. | 7,407 | — | — | — | — | 7,407 |
| 1981 .. | 2,389 | 2,777 | — | — | — | 5,166 |
| 1982 .. | 1,449 | 2,683 | 1,918 | — | — | 6,050 |
| 1983 .. | 1,077 | 1,988 | 1,938 | 1,319 | — | 6,322 |
| 1984 .. | 1,956 | 1,992 | 1,381 | 446 | — | 5,775 |
| 1985 .. | 44 | 823 | 3,423 | 1,045 | — | 5,335 |
| 1986 .. | 780 | 2,151 | 1,260 | 583 | — | 4,774 |
| 1987 .. | 182 | 1,407 | 857 | 274 | — | 2,720 |
| 1988 .. | 14 | 1,081 | 656 | 85 | 3,270 | 5,106 |
| 1989 .. | 9 | 1,008 | 324 | 1,305 | 94 | 2,740 |
| 1990 (අ) .. | 1,680 | 3,427 | 3,492 | 366 | — | 8,588 |
| එකතුව .. | 30,555 | 19,337 | 14,872 (ආ) | 5,423 | 3,364 | 73,551 |

මූලය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

(අ) තාවකාලිකයි.

(ආ) ඉඩම් කට්ටි 377 අවලංගු කිරීමේ හේතුවෙන් පවුල් පදිංචි කිරීම පිළිබඳ වාර්ෂික දත්තයන්ගේ එකතුව මුළු පදිංචි කිරීම් හා නොසැසඳේ.

සටහන : 1990 ට පෙර දත්තයන් සංශෝධිතයි.

1990 වර්ෂයෙහිදී මහවැලි බිල ප්‍රදේශය තුල වී වගා කල බිම් ප්‍රමාණය හෙක්ටයාර 93,123 කි. පසුගිය වර්ෂයෙහි වගා කරන ලද බිම් ප්‍රමාණය වන හෙක්ටයාර 66,092 සමඟ සසඳා බලන කල මෙය සියයට 41 ක සැලකිය යුතු වැඩිවීමකි. පසුගිය වර්ෂයෙහි වෙනත් බෝග වගා කරන ලද බිම් ප්‍රමාණය වූ හෙක්ටයාර 9,520 සමඟ සසඳා බලන කල, 1990 වර්ෂයේදී එම බිම් ප්‍රමාණය හෙක්ටයාර 21,265 දක්වා දෙගුණයකට වඩා වැඩිවීමක් දක්වයි.

මහවැලි බල ප්‍රදේශය තුල 1990 වර්ෂයේ දී නිෂ්පාදනය කරන ලද වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 389,182 ක් විය. මෙය පසුගිය වර්ෂයේ නිෂ්පාදනය සමඟ සසඳා බලන කල, සියයට 43 ක සැලකිය යුතු වැඩිවීමකි. ' එච් ' කලාපයෙහි නිෂ්පාදනය කළ වී ප්‍රමාණය පමණක් මෙට්‍රික් ටොන් 166,362 ක්වූ අතර, මෙය මහවැලි බල ප්‍රදේශයෙහි මුළු නිෂ්පාදනයෙන් සියයට 43 කි.

1989 වර්ෂයේදී පසු බැසීමකට ලක් වූ මහවැලි සංවර්ධන වැඩපිළිවෙල යටතේ ගොවි පවුල් පදිංචි කරවීමේ වැඩකටයුතු, 1990 වර්ෂයේ දී සිවිල් කලබල අඩුවීමත් සමඟ සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත්විය. 1990 වර්ෂයෙහිදී කඩිනම් මහවැලි වැඩපිළිවෙල යටතේ එන කලාපයන්හි පදිංචි කරවූ මුළු පවුල් (ගොවි සහ ගොවි නොවන පවුල්) සංඛ්‍යාව 8,588 කි. මෙය කඩිනම් මහවැලි වැඩපිළිවෙල ආරම්භයේ සිට මේ දක්වා වර්ෂයක් තුලදී පදිංචි කරන ලද වැඩිම පවුල් සංඛ්‍යාව විය. 1990 වර්ෂය තුල ' බී ' සහ ' සී ' යන කලාපවල පදිංචි කරන ලද පවුල් සංඛ්‍යාව පිළිවෙලින් 3,492 ක් සහ 3,427 ක් විය. පසුගිය වර්ෂ කිහිපය තුල අඩුවීමේ ප්‍රවනතාවයක් දක්වූ ' එච් ' කලාපයෙහි පදිංචි කල පවුල් සංඛ්‍යාව, සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් 1990 වර්ෂයෙහි දී 1,680 දක්වා වැඩිවිය. මෙයින් පවුල් 1,595 ක් ප්‍රදේශය තුල විධිමත් පදිංචිකරුවන් බවට පත් කරවනු ලැබූ අනවසරයෙන් පදිංචි වූවන් වේ.

**වෙනත් වාරිමාර්ග සංවර්ධනය**

1990 වර්ෂයෙහි වෙනත් වාරිමාර්ග සංවර්ධන වැඩකටයුතු, කඩිනම් මහවැලි වැඩපිළිවෙල ක්‍රියාත්මක නොවන සෑම ප්‍රදේශයකම දැනට පවතින වාරිමාර්ග යෝජනා ක්‍රම සංවර්ධනය සහ ගොවි සංවිධානවල කාර්‍යක්ෂම සහභාගිත්වයෙන් සඵල වාරිමාර්ග ක්‍රම කළමණාකරණය වැඩිදියුණු කිරීම කෙරෙහි සීමා විය.

කිරිඳිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියේ පළමුවන සහ දෙවන අදියර, නිල්වලා ගඟ ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය, ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සහ මිණිපේ-නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය 1990 වර්ෂය තුලදී ක්‍රියාත්මක වූ ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘතීන් වේ. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල ද එය ක්‍රියාත්මක වන සමහර දිස්ත්‍රික්කයන්හි වාරිමාර්ග ව්‍යාපෘතීන්ට සම්බන්ධව කටයුතු කරන ලදී. වාරිමාර්ග ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වූ බොහෝ ප්‍රදේශයන්හි සිවිල් කලබල අඩුවීමත් සමග 1990 වර්ෂයෙහි දී වාරිමාර්ග ව්‍යාපෘතීන්හි සංවර්ධන කටයුතු සැලකිය යුතු ප්‍රගතියක් ලැබිය. කෙසේ වුවද, ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තවදුරටත් හිඟව පැවති හෙයින්, මෙම ව්‍යාපෘතීන්හි ප්‍රගතිය ඉලක්කගත මට්ටම්වලට වඩා අඩුවිය.

කිරිඳිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියෙහි පළමුවන පියවරෙහි ඉදිකිරීම් සහ ඇල පද්ධතීන්හි වැඩ කටයුතු අවසන් වී ඇති බැවින්, 1990 වර්ෂය තුළදී ගොවි පවුල් පදිංචි කිරීම් සහ ජල සැපයුම් යෝජනා ක්‍රමයෙහි වැඩකටයුතු කරන ලදී. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අනුව, කිරිඳිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියේ පළමුවන සහ දෙවෙනි පියවර යටතේ වර්ෂය තුලදී පවුල් 236 පදිංචි කරවන ලදී. මෙම ව්‍යාපෘතියේ දෙවන පියවර යටතේ, වසර තුලදී හෙක්ටයාර 266 කට වාරිමාර්ග පහසුකම් සපයනු ලැබිය. වර්ෂය තුළදී කිරිඳිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියේ පළමුවන සහ දෙවන පියවර සඳහා දැරූ වියදම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 11 ක් සහ දශ ලක්ෂ 90 ක් වේ.

## 1.31 සංඛ්‍යා සටහන

### තෝරා ගත් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා වූ වියදම

| ව්‍යාපෘතිය | ආධාර ලබා ගත් මූලාශ්‍රය | මුළු විදේශ විනිමය ලැබීම් (දශ ලක්ෂ) | 1989 වියදම (රු. දශ ලක්ෂ) | 1990 (අ) වියදම (රු. දශ ලක්ෂ) | 1990 (අ) අවසානය දක්වා සමුච්චිත වියදම් (රු. දශ ලක්ෂ) |
|---|---|---|---|---|---|
| 1. කිරිඳි ඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතිය-පියවර I .. | ඒ.ඩී.බී.<br>කේ.එෆ්.ඩබ්.<br>අයි.එෆ්.ඒ.ඩී.<br>අයි.එෆ්.ඒ.ඩී. | ඇ.එ.ජ.ඩො. 30·0<br>ඩොයිෂ් මාර්ක් 43·5<br>එස්.ඩී.ආර්. 5·5<br>ඇ.එ.ජ.ඩො. 12·0 | 52·2 | 11·0 | 1,693·1 |
| 2. කිරිඳි ඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතිය–පියවර II .. | ඒ.ඩී.බී. | එස්.ඩී.ආර්. 22·2 | 85·1 | 89·5 | 286·3 |
| 3. ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය .. | අයි.ඩී.ඒ. | එස්.ඩී.ආර්. 24·4 | 73·7 | 117·7 | 928·0 |
| 4. නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතිය-අදියර II .. | ප්‍රංශය | ෆ්‍රෑන්ක් 200·0 | 80·6 | 16·2 | 1,050·9 |
| 5. මිණිපේ–නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය .. | ජපානය | යෙන් 1,295·0 | 1·3 | 19·0 | 20·3 |
| 6. වයඹ පලාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය .. | — | — | — | 14·1 | 14·1 |

(අ) තාවකාලිකයි.

මූලය : වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

1990 වර්ෂයෙහිදී නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතියේ දෙවෙනි අදියරෙහි වැඩ කටයුතුවල සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා වර්ෂය තුළදී වැය කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ 16 ක් වේ.

වයඹ පළාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය 1990 වර්ෂයෙහි මාර්තු මාසයේදී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි වාරිමාර්ග යෝජනා ක්‍රම 12 ක් පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තුවන අතර, එමගින් හෙක්ටයාර 9,873 ක් පමණ වන අළුත් සහ දනට වගා කර ඇති බිම් ප්‍රමාණයකට වාරිමාර්ග පහසුකම් සැපයීමට බලාපොරොත්තු වේ. මෙම ව්‍යාපෘතිය සඳහා වැය වන මුළු මුදල රුපියල් දශ ලක්ෂ 452 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එයින් රුපියල් දශ ලක්ෂ 14 ක් 1990 වර්ෂය තුළදී වැය කරන ලදී. මිනිපේ-නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 19 ක් වැය කරන ලදී.

ජාත්‍යන්තර සංවර්ධන ආයතනයෙහි ආධාර ලබන ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය විසින් 1990 වර්ෂය තුළදී සුළු වාරිමාර්ග ක්‍රම 129 ක වැඩකටයුතු නිම කරන ලද අතර, එමගින් හෙක්ටයාර 3,021 ට වාරිමාර්ග පහසුකම් සපයන ලදී. සුළු වාරිමාර්ග ක්‍රම 81 ක පුනරුත්ථාපන කටයුතු මෙම ව්‍යාපෘතිය යටතේ ආරම්භ කරන ලදී. 1990 වර්ෂය තුළදී ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ වැය කරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 118 ක් වේ.

විමධ්‍යගත අයවැය යටතේ අදාල පළාත් සභාවලට වෙන් කරන ලද අරමුදල්වලින් විශේෂයෙන් අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල ද වාරිමාර්ග සංවර්ධන වැඩකටයුතු සිදු කෙරිණි. ඒකාබද්ධ වාරිමාර්ග ක්‍රම කළමනාකරන ව්‍යාපෘතිය යටතේ, බෙදුම් ඇළ ගොවි සංවිධාන පිහිටුවීමේ වැඩ කටයුතු 1990 වර්ෂයේදී කරන ලදී. 1990 වර්ෂය අවසන් වනවිට පිහිටුවා තිබුණු මුළු කෙත් ඇළ ගොවි සංවිධාන සංඛ්‍යාව 5,836 කි.

### ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල මධ්‍යම මට්ටමෙහි පුළුල් සම්බන්ධීකරණයක් පවත්වන අතර, සංවර්ධන වැඩ කටයුතු විමධ්‍යගත කිරීමෙන් ග්‍රාමීය පෙදෙස්වල ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සහ දුප්පත්කම නැති කරලීමට තවදුරටත් අවධානය යොමු කරන ලදී.

මෑත අතීතයේදී, අභ්‍යන්තර කළබලවල ප්‍රතිඵලයක් ලෙස තාවකාලිකව අත්හිටුවා තිබුණු මන්නාරම, වවුනියා සහ මුලතිව් යන දිස්ත්‍රික්කයන්හි ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන්, ඒ සඳහා ආධාර දෙනු ලැබූවන් විසින් ශ්‍රී ලංකා රජයේ එකඟත්වය ඇතිව එම ව්‍යාපෘතීන්හි කටයුතු නතර කළ හෙයින්, 1990 දී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙලට දිස්ත්‍රික්ක 12 පමණක් ඇතුලත් විය. ගාල්ල දිස්ත්‍රික්කය සඳහා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් පිළිබඳ යෝජනාවක් සකස් කිරීමට 1990 දී ආසියානු සංවර්ධන බැංකුවෙන් තාක්ෂණික ආධාර ලැබුණි. අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා වන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියට සහය දීමට ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (සීඩා) එකඟ වී ඇත.

1989 වර්ෂයෙහිදී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල සඳහා වැය වූ රුපියල් දශ ලක්ෂ 332 සමඟ සසඳන කල, 1990 වසරේදී මෙම වැඩපිළිවෙලට වැය කරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 694 ක් විය. 1989 සහ 1990 වර්ෂයන් තුළදී කරන ලද මුළු වියදම සමඟ 1990 වසර අවසානය දක්වා වූ සියළුම ව්‍යාපෘතිවල සමුච්චිත වියදම 1.32 සංඛ්‍යා සටහනෙහි දක්වේ. 1989 වසර තුළදී දැඩි පසුබෑමකට ලක් වූ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල යටතේ වූ සංවර්ධන වැඩ කටයුතු, 1990 වර්ෂයෙහිදී ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වූ ප්‍රදේශවල අභ්‍යන්තර කලබල අඩු වී යෑමත් සමඟම යථා තත්ත්වයට පත්වීමක් වාර්තා කරන ලදී.

## 1.32 සංඛ්‍යා සටහන

### ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල - දිස්ත්‍රික්ක අනුව වියදම 1989-1990

රුපියල් දශ ලක්ෂ

| දිස්ත්‍රික්කය (අ) | | විදේශාධාර මූලාශ්‍රය | ගණන් බලන ලද වියදම | | එකතුව | සමුච්චිත වියදම | | වියදම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | විදේශිය | දේශීය | | 1989 වර්ෂය අවසානය දක්වා | 1990 වර්ෂය අවසානය දක්වා (ආ) | 1989 වර්ෂය තුළදී | 1990 වර්ෂය තුළදී (ආ) |
| 1. මාතර | (1979) | .. සිඩා (ස්විඩනය) | 338 | 37 | 375 | 197 | 240 | 22 | 43 |
| 2. හම්බන්තොට | (1979) | .. නෝරාඩ් (නෝර්වේ) | 686 | 14 | 700 | 494 | 571 | 47 | 76 |
| 3. නුවරඑළිය | (1979) | .. නෙදර්ලන්තය | 510 | 10 | 520 | 312 | 349 | 25 | 37 |
| 4. මාතලේ | (1981) | .. ලෝක බැංකුව | 337 | 131 | 468 | 415 | 434 | 30 | 19 |
| 5. පුත්තලම | (1981) | .. ලෝක බැංකුව | 406 | 191 | 597 | 579 | 605 | 34 | 26 |
| 6. බදුල්ල | (1981) | .. කෘෂි. සං. ජා. අරමුදල | 500 | 110 | 610 | 308 | 357 | 31 | 50 |
| 7. රත්නපුරය | (1984) | .. නෙදර්ලන්තය | 209 | 4 | 213 | 142 | 169 | 17 | 28 |
| 8. මොණරාගල | (1984) | .. නෝරාඩ් (නෝර්වේ) | 413 | 8 | 421 | 180 | 236 | 35 | 56 |
| 9. කෑගල්ල | (1986) | .. කෘෂි. සං. ජා. අරමුදල | 262 | 147 | 409 | 102 | 144 | 29 | 43 |
| 10. කළුතර | (1987) | .. ෆිනිඩා (ෆින්ලන්තය) | 371 | 66 | 437 | 120 | 172 | 56 | 52 |
| 11. මහනුවර | (1987) | .. ජර්මන් ෆෙඩරල් ජනරජය | 60 | 2 | 62 | 17 | 22 | 6 | 5 |
| 12. ගම්පහ | (1989) | .. ජපානය | 521 | 38 | 559 | 0.5 | 260 | 0.5 | 259 |

(අ) ක්‍රියාත්මක කරන ලද වර්ෂය වරහන් තුළින් දක්වේ.

(ආ) තාවකාලිකයි.

මූලය : ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය.